# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,505 — 2007 ජූලි 06 වැනි සිකුරාදා — 2007.07.06

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

### තනතුරු – ඇබෑර්තු

**ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි නඩත්තු නිලධාරි (ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II "ආ" ඛණ්ඩයේ) තනතුරට බඳවා ගැනීම්**

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි නඩත්තු නිලධාරි ශ්‍රී ලංකා තක්ෂණ සේවයේ II "ආ" ඛණ්ඩයේ තනතුර සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *සාමාන්‍ය සුදුසුකම්* :

(i) වයස අවු. 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය. (රාජ්‍ය සේවයේ නියුතු වූවන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ).

(ii) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

(iii) රාජකාරි අවශ්‍යතාව මත දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට එකඟ විය යුතුය.

02. *අධ්‍යාපන සුදුසුකම්.*– භාෂාව හෝ සාහිත්‍ය, අංක ගණිතය/ගණිතය ඇතුළු විෂයයන් 06කින් සම්මාන සාමාර්ථ 04ක් සහිතව අ. පො. ස. (සා. පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්වීම හෝ සමාන විභාගයකින් සමත්වීම.

03. *වෘත්තීය සුදුසුකම්* :

(i) මොරටුව විශ්ව විද්‍යාලයේ හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණ ඩිප්ලෝමා (සිවිල්)

හෝ

(ii) ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව (සිවිල්)

හෝ

iii. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව (සිවිල්)

හෝ

(iv) විවෘත විශ්ව විද්‍යාලය මගින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව

හෝ

(v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය මගින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ පළමුවන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම

හෝ

(vi) ඉහත තාක්ෂණික සුදුසුකම්වලට සමාන ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය මගින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම්.

04. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.*- මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.

05. *සේවා කොන්දේසි.*– ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10-12 දක්වා වගන්ති අදාල වේ.

06. *වැටුප් පරිමාණය* :

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I පන්තිය, II "අ" ඛණ්ඩය හා II "ආ" ඛණ්ඩයට නියමිත වැටුප් පරිමානය

මාසික රු. 14,140-10x140-11 x 150-6 x 210-14 x 290-රු. 22,510 (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 හි MT 2-2006 අනුව වැටුප් පරිමාණය)

තනතුරට පත් වී වසර තුනක් ඇතුලත පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

07. *බඳවා ගැනීමේ ක්‍රමය.*– රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/90 යටතේ තාක්ෂණ සේවා මණ්ඩලයේ අධීක්ෂණය යටතේ පැවැත්වෙන තරග විභාගයක ප්‍රතිඵල මත තනතුරට බඳවා ගනු ලැබේ. විභාගය පැවැත්වෙන දිනය හා විභාග පරිපාටිය දැනුම් දෙනු ලැබේ.

08. *ඉල්ලුම් කළ යුතු ආකාරය* :

8.1 මෙම නිවේදනයේ දැක්වෙන ආදර්ශ ආකෘතිය පරිදි 4ඒ ප්‍රමාණයේ කඩදාසියක සකස් කරන ලද අයදුම්පත් 2007 ජූලි මස 27 දිනට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, අංක 07, රීඩ් මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II "ආ" "ගොඩනැගිලි නඩත්තු නිලධාරි" තනතුරට බඳවා ගැනීම යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය. (දැනටමත් රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් ඉල්ලුම්පත් තම සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය.)

8.2 රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකරුවෙකු, පූජ්‍ය ස්ථානයක් භාර පූජකවරයෙකු, නීතිඥයෙක් හෝ රු. 94,080 නොඅඩු වාර්ෂික වැටුපක් ලබන රජයේ නිලධාරියෙකු විසින් අපේක්ෂකයාගේ අත්සන සහතික කළ යුතුය.

8.3 සෑම අයුරකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ලැබුණු බව හෝ ප්‍රතික්ෂේප කළ බව දන්වා එවනු නොලැබේ.

8.4 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2007 ජූලි මස 27 දින වේ.

09. *සාවද්‍ය තොරතුරු සැපයීම.*– යම් අපේක්ෂකයෙකු සුදුසුකම් නොමැති බව පත්වීම ලැබීමට පෙර ඕනෑම අවස්ථාවක දී අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත. පත්වීම් ලැබීමෙන් පසු දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවාම සේවයෙන් පහ කෙරෙනු ඇත.

10. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාල කරුණු හෝ මෙම නිවේදනයෙන් අනාවරණය නොවුන වෙනත් කරුණු සම්බන්ධව ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂගේ තීරණය අවසාන තීරණය වේ.

ආචාර්ය සරෝජා වෙත්තසිංහ,
ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ.

2007 ජුනි මස 19 වැනි දින,
ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව,
අංක 07,
රීඩ් මාවත,
කොළඹ 07.

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි නඩත්තු නිලධාරි (ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ **II "ආ"** ඛණ්ඩයේ) තනතුරට බඳවා ගැනීමේ අයදුම්පත්‍රය

01. (i) මුලකුරු සමග නම :————.
(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.

02. (i) ස්ථිර පදිංචි ස්ථානයේ ලිපිනය :————.
දුරකතන අංකය :————.
(ii) දැනට පදිංචි ස්ථානයේ ලිපිනය :————.
දුරකතන අංකය :————.
(iii) කාර්යාලීය ලිපිනය :————.
දුරකථන අංකය :————.

03. ජාතික හැඳුනුම්පත් අංකය :————.

04. උපන් දිනය : අවු.:———— මාස:————. දින:————.

05. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :
අවු.:————. මාස:————. දින:————.

06. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

07. විවාහක/අවිවාහක බව :————.

08. *අධ්‍යාපන සුදුසුකම්* :

i. අ. පො. ස. (සා. පෙළ) විභාගය:
වර්ෂය :————. මාධ්‍ය:————. විභාග අංකය:————.
විෂයය ශ්‍රේණිය
.................. .................. ..................

ii. අ. පො. ස. (උ. පෙල) විභාගය:
වර්ෂය:————. මාධ්‍ය:————. විභාග අංකය:————.
විෂයය ශ්‍රේණිය
.................. .................. ..................

09. *වෘත්තීය හා වෙනත් සුදුසුකම්* :

(i) හදාරා ඇති පාඨමාලාවන් පිළිබඳ විස්තර:

| *පාඨමාලාව හදාරා ඇති ආයතනයේ නම* | *කාලය සිට - දක්වා* | *හැදෑරූ පාඨමාලාව* | *ලැබූ සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |

(ii) *වෙනත් සුදුසුකම් පිළිබඳ විස්තර* :

10. ඔබ උසාවිය ඉදිරියේ කිසියම් චෝදනාවකට වරදකරු වී ඇද්ද ?
ඔව්/නැත.
ඔව් නම් විස්තර සපයන්න:————.

11. *අයදුම්කරුගේ සහතිකය:*

(i) මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව අවංකව ම ප්‍රකාශ කරමි.

(ii) මා විසින් කරනු ලැබූ මෙම ප්‍රකාශය මා සේවයට බඳවා ගැනීමට පෙර අසත්‍ය බව ඔප්පු වුවහොත් නුසුදුස්සෙකු වන බව හා පත්වීම් ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවාම සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව මම දැන සිටිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :

ඉහත අත්සන් කර ඇති .................... මයා/මෙය/මිය හා හොඳින් දන්නා හඳුනන බවත් ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් යෙදූ බවත් මෙයින් සහතික කරමි.

නම :————.
නිල නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

————.
අත්සන හා නිල මුද්‍රාව

13. *දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය (රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන්ට පමණයි):*

මෙම ඉල්ලුම්කරු වන ..............................................මහතා/මිය/මෙය ..........................................දින සිට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවය කරනු ලබයි. ඔහු/ඇය ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත/තාවකාලික/අනියම් ..............................................තනතුර දරයි. පසුගිය වසර 05ක කාලය තුල වේතනාධික සියල්ල උපයාගෙන ඇත. ඔහුගේ/ඇයගේ වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායකය. ඔහු/ඇය මොනයම් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම හැර) යටත් කොට නොමැති බව සහතික කරමි. තව ද ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් නිදහස් කළ හැකිය/නොහැකිය.

————.
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ
අත්සන.

නම :————.
පදවි නාමය :————.
දෙපාර්තමේන්තුව/ආයතනය :————.
දිනය :————.

07-48/1

---

**ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ වඩු ශිල්පී (11 පංතිය) තනතුරට බඳවා ගැනීම**

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ වඩු ශිල්පී (11 පංතිය) තනතුර සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.*– මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ.

03. *සේවා කොන්දේසි.*– ආයතන සංග්‍රහයේ 11 පරිච්ඡේදයේ 10-12 වගන්ති අදාල වේ.

04. *වැටුප් පරිමාණය* :

මාසික 12,140-10 x 110 - 10 x 120 10 x 130 x 12 x 140 රු.17,420 (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 හි PL 2 - 2006 අනුව).

තනතුරට පත්වී වසර 03ක් ඉක්මවීමට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතුය.

05. *සාමාන්‍ය සුදුසුකම්* :

(i) වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය (දැනට රාජ්‍ය සේවයේ නියුතු වූවන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ).

(ii) විශිෂ්ඨ චරිතයකින් මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

(iii) රාජකාරි අවශ්‍යතාවය මත දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට එකඟ විය යුතුයි.

06. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* :

(i) අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලකින් 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුයි.

(ii) 1/32 පරිමාණයෙන් කියවීමට හැකියාව තිබිය යුතුයි.

07. *වෘත්තීය සුදුසුකම්:*

වඩු කාර්මික ශිල්පය පිළිබඳ කාර්මික විද්‍යාලය, ජාතික ආධුනිකත්ව මණ්ඩලය හෝ ජාතික පුහුණු අධිකාරිය වැනි රජය පිළිගත් ආයතනයක මාස 06ක් හෝ ඊට වැඩි පුහුණුවක්.

08. *බඳවා ගැනීමේ ක්‍රමය:*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/90 යටතේ ප්‍රායෝගික පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 ජූලි මස 13 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 ජුනි මස 29 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

**ලක්ෂමන් ගුණවර්ධන**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.


රජයේ මුද්‍රණාලයාධිපති විසින් ප්‍රකාශ කරන ලදී.

*විෂය නිර්දේශය* :

(i) වඩු කර්මාන්තයේ භාවිතාවන ආයුධවලින් වැඩ කිරීම පිළිබඳ හැකියාව පරීක්ෂා කිරීම.

(ii) සරල පිරිද්දුම හඳුනා ගැනීම හා සෑදීම.

(iii) සරල ඇඳීම් කියවීම් හා නිර්මාණ කිරීම (සිංහල දෙමල හා ඉංග්‍රීසි භාෂා වලින් පවත්වන මෙය පැය 06 ක ප්‍රායෝගික පරීක්ෂණයකි).

09. *ඉල්ලුම් කළ යුතු ආකාරය* :

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි ඒ4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කරන ලද අයදුම්පත් 2007 ජූලි මස 27 දිනට පෙර ලැබෙන සේ ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, අංක 07, රීඩ් මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "වඩු ශිල්පී (II පංතිය) තනතුරට බඳවා ගැනීම" යනුවෙන් පැහැදිලිව සඳහන් කළයුතුය.

(දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් ඉල්ලුම්පත් තම සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය.).

රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, පූජ්‍ය ස්ථානයක් භාර පූජකවරයෙකු, නීතිඥයකු හෝ රු. 94,080 ට නොඅඩු වාර්ෂික වැටුපක් ලබන රජයේ නිලධාරියෙකු විසින් අපේක්ෂකයාගේ අත්සන සහතික කළ යුතුය.

සෑම අයුරකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර අයදුම්පත් ලැබුණු බව හෝ ප්‍රතික්ෂේප කළ බව දන්වා එවනු නොලැබේ.

(iv) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2007 ජූලි මස 27 දින වේ.

10. *සත්‍ය තොරතුරු සැපයීම.*–

යම් අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව පත්වීම ලැබීමට පෙර ඕනෑම අවස්ථාවක දී අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත. පත්වීම ලැබීමෙන් පසු දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් ම යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවාම සේවයෙන් පහ කරනු ලැබේ.

11. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාල කරුණු හෝ මෙම නිවේදනයේ අනාවරණය නොවන වෙනත් කරුණු සම්බන්ධව ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂකගේ තීරණය අවසාන තීරණය වේ.

ආචාර්ය සරෝජා වෙත්තසිංහ,
ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ.

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව,
අංක 07, රීඩ් මාවත, කොළඹ 07.

### ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව

*වඩු ශිල්පී 11 තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. මුලකුරු සමග නම :————————.
02. මුලකුරුවලින් හැඳින්වෙන නම :————————.
03. පෞද්ගලික ලිපිනය :————————.
04. රාජකාරි ලිපිනය :————————.
05. දැනට පදිංචි ලිපිනය හා දිස්ත්‍රික්කය :————————.
06. (i) උපන් දිනය: අවුරුද්ද :————.මාසය:————.දිනය:————
(ii) ඉල්ලුම්පත් භාර ගන්නා දිනට වයස :
අවුරුදු :————.මාස :————————.දින :————————.
07. උපන් ස්ථානය :————————.
ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද යන වග :————————.
08. ස්ත්‍රී/පුරුෂ භාවය :————————.
09. විවාහක/අවිවාහක බව :————————.
10. (i) අධ්‍යාපන සුදුසුකම්:————————.
(ii) වෘත්තීය සුදුසුකම්:

| *ආයතනයේ නම* | *කාලය සිට දක්වා* | *හැදෑරූ පාඨමාලාව හා සාමාර්ථය* |
| --- | --- | --- |
| | | |

11. මීට කලින් රජයේ යම් කිසි දෙපාර්තමේන්තුවක හෝ රජයේ සංස්ථාවක සේවය කලේ නම් එයින් අස්වීමට හේතු :————————.

12. යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියක දී වරදකරු වී ඇත්නම් එම වරද හා ලැබූ දඬුවම පිළිබඳ විස්තර :————————.

13. වෙනත් විස්තර :————————.

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන විස්තර සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත් පත් කිරීමෙන් පසු අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————————.
අයදුම්කරුගේ අත්සන

දිනය :————————.

14. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

ඉහත අත්සන් කර ඇති .......................... මයා/මිය/මෙනවිය මා හොඳින් දන්නා හඳුනන බවත් ඔහු/ඇය මා ඉදිරිපිටදී අත්සන් යෙදූ බවත් මෙයින් සහතික කරමි.

නම :————————.
නිල මුද්‍රාව :————————.
ලිපිනය :————————.
දිනය :————————.

අත්සන :————————.
නිලමුද්‍රාව :————————.

15. අයදුම්පත් රාජ්‍ය සේවයේ නියුක්ත අයෙකු නම් දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය.

............................................. ගේ ඉල්ලුම්පත ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම ආයතනයේ/දෙපාර්තමේන්තුවේ ස්ථිර/තාවකාලික/අනියම් සේවයේ ....................................... වශයෙන් සේවය කරන බවත්, මේ තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහුව/ඇයව සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————————.
ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

දිනය :————————.
ආයතනය :————————.

07-48/2

---

### රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ උප්පැන්න, මරණ සහ විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු

මහනුවර දිස්ත්‍රික්කය - අවලංගු කිරීම

ම විසින් පලකරන ලද මහනුවර දිස්ත්‍රික්කයේ පහත සඳහන් කොට්ඨාශවල උප්පැන්න මරණ සහ විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවීමේ නිවේදනවල සඳහන් අයදුම්පත් කැඳවීම නව බඳවා ගැනීමේ පරිපාටි ක්‍රියාත්මක කිරීම සඳහා මෙයින් අවලංගු කරමි.

එල්. කේ. රත්නසිරි,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2007 ජුනි මස 07 වැනි දින,
කොළඹ 11, කෙළින් වීදිය, අංක 280
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය* | *ඉල්ලුම්පත් කැඳවූ කොට්ඨාශය සහ තනතුර* | *ගැසට් පත්‍රයේ අංකය සහ දිනය* |
| --- | --- | --- | --- |
| මහනුවර | උඩපලාත | උඩපලාත කොට්ඨාශයේ දුනුකේඋල්ල ප්‍රදේශයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | 1451 සහ 2006.06.23 |
| මහනුවර | කඩවත් සතර සහ ගඟවට කෝරළය | ගඟවට කෝරළය කොට්ඨාශයේ ගැටඹේ ප්‍රදේශයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | 1451 සහ 2006.06.23 |
| මහනුවර | පන්විල | පාතදුම්බර කොට්ඨාශයේ පන්විල ප්‍රදේශයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | 1451 සහ 2006.06.23 |
| මහනුවර | තුම්පනේ | තුම්පනේ ගංඅට කොට්ඨාශයේ උප්පැන්න මරණ සහ තුම්පනේ කොට්ඨාශයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | 1451 සහ 2006.06.23 |
| මහනුවර | යටිනුවර | උඩුනුවර හා යටිනුවර කොට්ඨාශයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | 1451 සහ 2006.06.23 |
| මහනුවර | උඩපලාත | ගම්පොල නගරය මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | 1450 හා 2006.06.16 |
| මහනුවර | උඩපලාත | ගම්පොල ආඩියාකඩවත ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | 1450 හා 2006.06.16 |
| මහනුවර | යටිනුවර | උඩුනුවර හා යටිනුවර කොට්ඨාශයේ දෙහිඅංග මුරුතලාව ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | 1450 හා 2006.06.16 |
| මහනුවර | කඩවත් සතර සහ ගඟවට කෝරළය | ගඟවට කෝරළය කොට්ටාශයේ උප්පැන්න මරණ සහ මහනුවර කොට්ඨාශයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධූරය | 1400 සහ 2005.07.01 |
| මහනුවර | පස්බාගේ කෝරළය | නාවලපිටිය නගරය වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධූරය | 1400 සහ 2005.07.01 |
| මහනුවර | ගගඉහල කෝරළය | උඩපලාත කොට්ඨාශයේ උලපනේ ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | 1398 සහ 2005.06.17 |
| මහනුවර | උඩුනුවර | උඩුනුවර හා යටිනුවර කොට්ඨාශයේ මීවලදෙණිය ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | 1398 සහ 2005.06.17 |
| මහනුවර | උඩුනුවර | උඩුනුවර යටිනුවර කොට්ඨාසයේ පෙතියාගොඩ ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | 1398 සහ 2005.06.17 |
| මහනුවර | කඩවත්සතර සහ ගඟවට | කඩවත් සතර සහ ගඟවට කෝරළය කොට්ඨාශයේ යටිනුවර ප්‍රදේශයේ අතිරේක විවාහ(උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | 1370 හා 2004.12.03 |
| මහනුවර | පාතහේවාහැට | මාරස්සන කොට්ඨාශයේ උප්පැන්න මරණ සහ පාතහේවාහැට කොට්ඨාශයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | 1328 හා 2004.02.13 |
| මහනුවර | එම | පාතහේවාහැට කොට්ඨාශයේ පිච්චමල්වත්ත ප්‍රදේශයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | 1328 හා 2004.02.13 |
| මහනුවර් | හාරිස්පත්තුව | හාරිස්පත්තුව කොට්ඨාශයේ හිඟුල්වල ප්‍රදේශයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | 1328 හා 2004.02.13 |
| මහනුවර | පූජාපිටිය | උඩගම්පහ අංක 01 කොට්ඨාශයේ උප්පැන්න මරණ සහ හාරිස්පත්තුව කොට්ඨාශයේ විවාහ(උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | 1318 හා 2003.1 1.28 |
| මහනුවර | කඩවත් සතර සහ ගඟවට කෝරළය | මහනුවර නගරය කොට්ඨාශයේ උප්පැන්න මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධූරය | 1307 හා 2003.09.19 |
| මහනුවර | පූජාපිටිය | හාරිස්පත්තුව කොට්ඨාසයේ ගල්හින්න ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | 1241 සහ 2002.06.14 |
| මහනුවර | පාතහේවාහැට | පාතහේවාහැට කොට්ඨාශයේ උඩදෙනි ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | 1241 හා 2002..06.14 |
| මහනුවර | පූජාපිටිය | හාරිස්පත්තුව කොට්ඨාශයේ බුළුගොහොතැන්න ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | 1241 හා 2002.06.14 |
| මහනුවර | මිනිපේ | කන්දපහල දකුණ කොට්ඨාශයේ උප්පැන්න මරණ සහ උඩුදුම්බර කොට්ඨාශයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | 1235 හා 2002.05.03 |
| මහනුවර | උඩුනුවර | උඩුනුවර කඳුපලාත කොට්ඨාශයේ උප්පැන්න මරණ සහ උඩුනුවර හා යටිනුවර කොට්ඨාශයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | 1235 හා 2002.05.03 |
| මහනුවර | හාරිස්පත්තුව | පල්ලේගම්පහ දකුණ (අංක 01) කොට්ඨාශයේ උප්පැන්න මරණ සහ හාරිස්පත්තුව විවාහ(උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | 1235 හා 2002.05.03 |
| මහනුවර | පාතදුම්බර | පාතදුම්බර පල්ලේගම්පහ බටහිර කොට්ඨාශයේ උප්පැන්න මරණ සහ පාතදුම්බර කොට්ඨාශයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය. | හා 1235 2002.05.03 |

07-63

---

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශයේ වනිතා සංවර්ධන නිලධාරීන්ගේ පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2006

ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශයේ වනිතා සංවර්ධන නිලධාරීන් සඳහා වූ පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2007 ඔක්තෝබර් මස කොළඹ දී පවත්වනු ලැබේ. මෙම විභාගය සඳහා අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනය 2007 ජූලි මස 20 දින බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. *විභාග පරිපාටිය.*–මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත වනු ඇත.

| | |
| --- | --- |
| විෂය අංක 01 - මුදල් රෙගුලාසි/කාර්යාල ක්‍රම | කාලය පැය 02යි, ලකුණු 100යි. |
| විෂය අංක 02 - ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා කාන්තා අයිතිවාසිකම් | එම |
| විෂය අංක 03 - සමාජ විද්‍යාව හා මනෝ විද්‍යා උපදේශනය | එම |

*සටහන*:-

(*අ*) සියලුම විෂයන් සඳහා එකම වාරයකදී හෝ වෙන් වශයෙන් වාර කිහිපයක දී හෝ පෙනී සිටීමට නිලධාරියෙකුට අවසර ඇත.

(*ආ*) සාමාර්ථය සඳහා සෑම ප්‍රශ්න පත්‍රයකින්ම ලකුණු 40%ක් හෝ ඊට වැඩියෙන් සෑම අපේක්ෂකයකුම ලබා ගත යුතුය.

03. *විෂයයන්* .–

(i) *මුදල් රෙගුලාසි/කාර්යාල ක්‍රම*
ශ්‍රී ලංකාවේ රාජ්‍ය කළමනාකරණ ව්‍යුහය
මූල්‍ය පාලනය හා වාර්ෂික ඇස්තමේන්තු
ආයතන සංග්‍රහයේ නියෝග හා මුදල් රෙගුලාසි
ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද ආවරණය කරනු ලැබේ.

I, II, IV, V, VII, IX, XII, XV, XXIII, XXVI, XXVII, XXX, XXXI, XXXII, XXXIII
ආණ්ඩුවේ මුදල් රෙගුලාසි 1 වැනි කාණ්ඩය (X පරිච්ඡේදය හැර)
කාර්යාල කළමනාකරණය

(ii) *ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා කාන්තා අයිතිවාසිකම්*
කාන්තාවන්ට එරෙහිව වෙනස්කම් කිරීම
ලාංකික සමාජයේ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය
ශ්‍රී ලංකා කාන්තා ප්‍රඥප්තිය හා කාන්තා හිමිකම්

(iii) *සමාජ විද්‍යාව හා මනෝ විද්‍යා උපදේශනය*
ග්‍රාමීය සමාජ විද්‍යාව
ශ්‍රී ලංකාවේ නාගරීකරණය
ශ්‍රම සංවර්ධනය
මනෝ විද්‍යා උපදේශනයේ මූලික ලක්ෂණ හා ආචාර ධර්ම
ස්ත්‍රිය සහ මානසික අක්‍රමිකතා
ශ්‍රී ලංකාවේ උපදේශන ව්‍යාපාරය හා උපදේශන අවස්ථා

04. මෙම පරීක්ෂණය සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම් පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ පළ කර ඇත. එම ආදර්ශ අයදුම්පත්‍රයට අනුව අපේක්ෂකයන් විසින් ස්වකීය අයදුම්පත්‍ර පිළියෙල කර ගත යුතුය. අයදුම්පත්‍ර පිළියෙල කර ගත යුත්තේ ඒ 4 ප්‍රමාණයේ කඩදාසියකය. අංක 01 සිට 06 දක්වා මුල් පිටුවේ ද සෙසු කොටස් දෙවන පිටුවේ වන ලෙසය. එය සම්පූර්ණ කළ යුත්තේ අපේක්ෂකයා විසින් සිය අත් අකුරිනි.

05. අයදුම්පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් (ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි නම් ප්‍රාදේශීය ලේකම් මගින්) 2007 ජූලි මස 20 දින හෝ ඊට පෙර බත්තරමුල්ල, පැලවත්ත, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, විභාග කොමසාරිස් ජනරාල් වෙත ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහා එවනු ලබන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. විභාග සඳහා අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනයට පසුව ලැබෙන හා අසම්පූර්ණ අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ කාර්යය සඳහා නව ප්‍රවේශක නිලධාරීන් විසින් තම අයදුම්පත්‍ර රාජ්‍ය භාෂාවෙන් හෝ තමන් සේවයට බඳවා ගන්නා ලද භාෂා මාධ්‍ය අනුව දෙමළ භාෂාවෙන්/ඉංග්‍රීසි භාෂාවෙන් හෝ පිළියෙල කොට ඉදිරිපත් කළ හැකිය.

06. අයදුම්පත්‍ර පිළිගෙන ඇති අපේක්ෂකයන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාල සටහනේ පිටපතක් සමග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරනවා ඇත. ඒ හා සමගම විභාග පැවැත්වෙන දිනය සඳහන් පුවත්පත් දැන්වීමක් ද පළවනු ඇත. යම් කිසි විභාග අපේක්ෂකයෙකුට විභාගය පැවැත්වීමට අඩු වශයෙන් දින හතරකටවත් පෙර ප්‍රවේශ පත්‍රයක් නොලැබුණහොත් ඒ බැව් පහත සඳහන් විස්තර සමග බත්තරමුල්ල, පැලවත්ත, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, විභාග කොමසාරිස් ජනරාල්, (විදුලි පණිවුඩ ලිපිනය විභාග බත්තරමුල්ල) වෙත අප්‍රමාදව ලියා දැන්විය යුතුය.

i විභාගයේ නම :————.
ii අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
iii සම්පූර්ණ ලිපිනය :————.
iv ඉල්ලුම්පත්‍රය තැපැල් කළ තැපැල් කාර්යාලය, ලියාපදිංචි අංකය සහ දිනය :————.

07. අනන්‍යතාව.- අපේක්ෂකයන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියවිලි අතුරින් කුමක් වුවත් භාර ගැනේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රයක් (පාස්පෝට් බලපත්‍රයක්)

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කල නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීම හෝ නොපිළිගැනීමට හෝ විභාග කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

08. *විභාග ගාස්තු.*– මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයන්ගෙන් පහත සඳහන් පදනම මත ගාස්තු අය කෙරේ.

| *විභාග ගාස්තු :* | *රු. ශත* |
|---|---|
| (අ) පළමුවන වතාව සඳහා ගාස්තු අය නොකෙරේ. | |
| (ආ) පළමුවන වතාවෙන් පසු සම්පූර්ණ විභාගය සඳහා | 115 00 |
| (ඇ) එක් විෂයයක් සඳහා | 75 00 |

අපේක්ෂකයාගේ අත්සන තබා නිසි පරිදි අවලංගු කල ආදායම් මුද්දර මගින් ගාස්තු ගෙවිය යුතුය.

09. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, ඔහු විසින් විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් නියම කරන ලද නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් කෙරේ.

10. මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති සහ විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍රයක් නිකුත් කර ඇති තමන්ගේ දෙපාර්තමේන්තු/කාර්යාලවල නිලධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා දෙපාර්තමේන්තු/කාර්යාල ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබා දිය යුතුය.

11. මෙම රෙගුලාසිවලට අඩංගු නොවූ යම් කරුණක් වෙතොත් ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශයේ අභිමතය පරිදි ඒ ගැන ක්‍රියා කරනු ඇත.

ලේකම්,
ළමා සංවර්ධන හා කාන්තා
අභිවෘද්ධි අමාත්‍යාංශය.

2007 ජුනි මස 14 වැනි දින,
ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශය,
අංක 177, නාවල පාර,
නාරාහේන්පිට.

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

**අයදුම්පත්‍රය**

**ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශයේ වනිතා සංවර්ධන නිලධාරීන්ගේ පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2006**

First Efficiency Bar Examination 2006 for Women Development Officers of Ministry of Child Development And Women's Empowerment

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

(අදාල අංකය කොටුව තුළ ලියන්න)

1. නම :
   1.1 මුලකුරු සමග නම :————.
   (මුලකුරු අගට යොදා (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
   උදා. - SILVA, A. B.
   1.2 මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
   (සිංහලෙන්/දෙමළෙන්)
   1.3 ජාතික හැඳුනුම්පත් අංකය :
2. කාර්යාලීය ලිපිනය :————.
   (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
   2.1 කාර්යාලීය ලිපිනය :————.
   (සිංහලෙන්/දෙමළෙන්)
   2.2 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————.
   (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
3. ස්ත්‍රී/පුරුෂ භාවය 3.1 ස්ත්‍රී - 1 පුරුෂ - 0
   (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
   3.2 විවාහක/අවිවාහක බව
   විවාහක - 1
   අවිවාහක - 2
   (අදාල අංකය කොටුව තුළ ලියන්න)
   3.3 උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :
   3.4 ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු :
   මාස : දින :

4. ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශයේ වනිතා සංවර්ධන නිලධාරිනී තනතුරට පත් වූ දිනය :————. (නිත්‍ය වශයෙන් රාජකාරි භාර ගත් දිනය සඳහන් කළ යුතුය.)

5. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා ආදි ප්‍රවේශකයෙක් ද? නැතහොත් නව ප්‍රවේශකයෙක් ද? :————.

6. දෙපාර්තමේන්තුවේ නම (ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් නම් එම කාර්යාලයේ නම) :————.

7. ගැසට් නිවේදනයේ 2 වන ඡේදය යටතේ ඉදිරිපත් වන විෂයන් හා විෂය අංක :

| *විෂය* | *විෂය අංකය* |
|---|---|
| 01 ........................ | |
| 02 ........................ | |
| 03 ........................ | |

8. පරීක්ෂණයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද? :————.

9. ඉහත සඳහන් විස්තර නිවැරදි බව ද, ඉහත දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බව ද ප්‍රකාශ කරමි.

දිනය :————.

————,
අපේක්ෂිකාවගේ අත්සන

*සටහන.*– තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකුගේ තමාගේ ප්‍රාදේශීය ප්‍රධානියාගේ ඉදිරිපිටදී අයදුම්කරු අත්සන් කල යුතුය.

**අත්සන සහතික කිරීම**

මාගේ කාර්යාලයේ නිලධාරිනියක වූ, මා පෞද්ගලිකව දන්නා හඳුනන ................................................ මෙය/මිය.....................................දින මා ඉදිරිපිටදී අත්සන් කළ බව මෙයින් සහතික කරමි.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.

————,
සහතික කරන්නාගේ අත්සන

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

i. ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්, එවා නිවැරදි බවත්,
ii. අපේක්ෂිකාව මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තැබිය යුතුයි.)

පදවි නාමය :————.
දිනය :————.
07-46

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පලකිරීම්

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

### සෞඛ්‍ය ආරක්ෂණ පෝෂණ සහ ඌව වෙල්ලස්ස සංවර්ධන අමාත්‍යාංශය

**කිළිටි රෙදි සේදීම - 2007/2008**

*ටෙන්ඩරය සහ ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම්-* 2007 ජූලි මස 15 වැනි දින සිට 2008 ජූලි මස 14 වැනිදායින් (දින දෙකම ඇතුළුව අවසාන වන වර්ෂය තුළ පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ කිළිටි රෙදි සේදීම සඳහා ශ්‍රී ලාංකිකයින්ගෙන් හා ශ්‍රී ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ අධ්‍යක්ෂ (මාතෘ හා ළමා සෞඛ්‍ය) විසින් භාරගනු ලැබේ.

02. (i) *ටෙන්ඩර් තැන්පත් මුදල්.*– රුපියල් හත් දහසක (රු. 7,000)ක මුදලක් පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ අධ්‍යක්ෂ (මාතෘ හා ළමා සෞඛ්‍ය) නමට තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුය. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති, ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුලත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට ද තැන්පත් නොතබා ටෙන්ඩර් පත් ඉල්ලිය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි කළ අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) *ටෙන්ඩර් පත්‍ර.*– ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනට පෙර දිනයේ දහවල් 12.00 වන තුරු මෙම කාර්යාලයෙන් රුපියිල් දෙසිය පණහක මුදලක් (රු. 250) ගෙවීමෙන් පසු ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සිය ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුය.

(iii) ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත් වේලාසනින් එවිය යුතුය.

03. *වත්කම් විස්තර.*– සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට සැලකිය යුතු කාලයකට පළමු තම වත්කම් අධ්‍යක්ෂ (මාතෘ හා ළමා සෞඛ්‍ය) වෙත දැන්විය යුතුය. මේ සඳහා අවශ්‍ය ආකෘති පත්‍ර කාර්යාලයෙන් ලබාගත හැක. වත්කම් ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට අපොහොසත් වීම නිසා ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල් අහිමි වන්නට ඉඩ තිබේ.

04. *සෝදන කෑලි ප්‍රමාණය පිළිබඳ විස්තර.*– අයදුම්පත්‍රයේ සඳහන් කළ යුතුය.

05. *ටෙන්ඩර් එවිය යුතු අන්දම.*– සියලුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා අධ්‍යක්ෂ (මාතෘ හා ළමා සෞඛ්‍ය) පවුල් සෞඛ්‍ය කාර්යාංශය, අංක 231, ද සේරම් පෙදෙස, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. කවරයේ වම් කෙළවරේ "කිලිටි රෙදි සේදීම සඳහා මිළ ගණන් " යනුවෙන් සඳහන් කළ යුතුය.

06. ටෙන්ඩර්පත් භාර ගන්නා අවසාන දිනය පුවත්පත් නිවේදනයේ සඳහන් කරනු ලැබේ.

07. *ටෙන්ඩර් පත් විවෘත කිරීම.*– ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට එම ස්ථානයේ ටෙන්ඩර්කරුවන්ට සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කර ඇති මිළ ගණන් ටෙන්ඩර්කරුවන් ඉදිරියේ ප්‍රකාශ කරනු ලැබේ.

08. ටෙන්ඩර්කරුවන්ගේ සඳහන් මිළ ගණන් වලංගු කාල සීමාව ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ජේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වන තුරු ගිවිසුම් පත්‍රයේ විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

09. *තැන්පත් මුදල්.*– තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු විසින් පළමු දින 10 ඇතුළත නියම කරනු ලබන ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතු වේ.

10. *ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.*– ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි සෞඛ්‍ය 834 ඇපුල්ලුම් කොන්ත්‍රාත් පෝර්මයේ සඳහන් වේ.

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව.

පවුල් සෞඛ්‍ය කාර්යාංශය,
අංක 231, ද සේරම් පෙදෙස,
කොළඹ 10.
07-73

---

### ශ්‍රී ලංකා දුම්රිය සේවය

**ශ්‍රී ලංකා දුම්රිය සේවය මගින් ආනයනය කරනු ලබන භාණ්ඩ පරීක්ෂා කිරීම සඳහා පරීක්ෂකවරුන් පත් කිරීම**

01. කොළඹ 10, ඕල්කොට් මාවතේ පිහිටි ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (සුළු) සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා ආනයනය කරන භාණ්ඩ නැව්ගත කිරීමට පෙර පරීක්ෂා කිරීම පිණිස සුදුස්සෙකු පත්කර ගැනීම සඳහා පිළිගත් ආයතන මගින් ඉදිරිපත් කරන මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් භාරගනු ලබයි.

02. ආපසු නොගෙවනු ලබන රු. 2,500ක මුදලක් හෝ පහසුවෙන් මාරුකළ හැකි ඒ හා සමාන විදේශ විනිමය ප්‍රමාණයක් ගෙවා කොළඹ 10, ඕල්කොට් මාවතේ, පිහිටි දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් හෝ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලින් 2007.08.22 දින ප. ව. 3.00 (ශ්‍රී ලංකා වේලාවෙන්) දක්වා ලබාගත හැකි ටෙන්ඩර් ආකෘති පත්‍රවල පමණක් මිළ ගණන් ඉදිරිපත් කළ යුතුය.

03. 2007.08.24 දින ප. ව. 2.00 (ශ්‍රී ලංකා වේලාවෙන්) දක්වා ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

04. ටෙන්ඩර්පත් භාරගැනීම අවසන් වූ වහාම කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය මූලස්ථාන කාර්යාලයේදී ටෙන්ඩර්පත් විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවට ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට සහභාගි විය හැකිය.

05. මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය හැක :-

සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (සුළු), ශ්‍රී ලංකා දුම්රිය සේවය, දුම්රිය මූලස්ථානය, ඕල්කොට් මාවත, කොළඹ 10.

06. කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී ටෙන්ඩර් ආකෘති පත්‍ර නොමිලයේ පරීක්ෂා කර බැලිය හැක. වැඩි විස්තර සඳහා දුම්රිය ගබඩා අධිකාරී විමසන්න.

දුම්රිය ගබඩා අධිකාරී, ශ්‍රී ලංකා දුම්රිය සේවය, ඕල්කොට් මාවත, කොළඹ 10.
දුරකථ අංක : 94 (11) 2432044 හෝ 94 (11) 2436818
ෆැක්ස් අංකය : 94 (11) 2432044 ඊ මේල් : sis@sierra.lk
(යොමුව : එස්. ආර්. එස්/එෆ්.6580)

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව(සුළු),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

07-113

---

### දිසා අධිකරණය – බලංගොඩ

බලංගොඩ දිසා අධිකරණයේ රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද පහත සඳහන් මෝටර් වාහන සඳහා 2007 අගෝස්තු මස 24 වැනි දින පෙ.ව. 10.00 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

| *අනු අංකය* | *විෂය* | *ටෙන්ඩර් ඇප තැන්පත්* | |
|---|---|---|---|
| | | *ආපසු නොගෙවන* | *ආපසු ගෙවන* |
| 01 | 41 ශ්‍රී 3950 ලොරි රථය | රු.100 00 | රු.1,000 00 |
| 02 | 50 ශ්‍රී 5906 වෑන් රථය | රු. 100 00 | රු.1,000 00 |

එදිනම එදිනම පෙ.ව. 10.15ට ටෙන්ඩර් පත් විවෘත කරනු ලබන අතර එම අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට පෙනීසිටීමට අවසර දෙනු ලැබේ.

2007 ජූලි මස 01 වන දින සිට 2007 අගෝස්තු මස 23 වන දින දක්වා කාර්යාල වේලාවන් තුලදී ඉහත දක්වා ඇති පරිදි ආපසු ගෙවන හා නොගෙවන ටෙන්ඩර් ඇප තැන්පත් සඳහා බලංගොඩ දිසා අධිකරණය වෙත ගෙවූ ලදුපත් අධිකරණන රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කර ටෙන්ඩර් අයදුම්පත් ලබාගත හැකිය.

වාහන පරීක්ෂා කිරීම අධිකරණ රෙජිස්ට්‍රාර් වරයාගේ අවසරය මත කාර්යාල වේලාව තුළදී කළ හැකිය.

නිසි ලෙස සම්පූර්ණ කර සීල් තබන ලද ටෙන්ඩර්පත් රෙජිස්ට්‍රාර්වරයා, දිසා අධිකරණය, බලංගොඩ යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලොරි/වෑන් සඳහා ටෙන්ඩර් වශයෙන් සඳහන් කළ යුතුය. එක් අයදුම්පතක් ඉදිරිපත් කළ හැක්කේ එක් වාහනයක් සඳහා පමණි.

ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිගේ නියෝගය අවසන් නියෝගය වේ.

වයි. එච්. ජී. එස්. විජේවර්ධන,
රෙජිස්ට්‍රාර්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
බලන්ගොඩ.

2007 ජුනි මස 14 වැනි දින,
බලංගොඩ දී ය.
07-22

---

## බඩු බාහිරාදිය විකිණීම්

### අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොම්ෂන් සභා කාර්යාලය

මෙම කොමිෂන් සභාවේ භාවිතයෙන් ඉවත් කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කටයුතු යොදා ඇත.

01. වෙන්දේසියේ විකුණනු ලබන භාණ්ඩ ලැයිස්තුවක් පහතින් දක්වා ඇත.

02. මෙම භාණ්ඩ 2007.07.26 වැනි දින පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා කාලය තුළ කොමිෂන් සභා කාර්යාල පරිශ්‍රයේ දී පරීක්ෂාකර බැලිය හැකිය.

03. 2007.07.27 වැනි දින පෙ. ව. 10.00 ට භාණ්ඩ වෙන්දේසිය ආරම්භ වන අතර, ගැණුම්කරුවන් විසින් එදිනම මුදලින් වටිනාකම ගෙවා තමන් මිලදී ගත් ලොට් අංකයට අදාළ සියළුම භාණ්ඩ ප. ව. 6.00 ට පෙර මෙම කාර්යාල භූමියෙන් ඉවත් කරගත යුතුය.

පියසේන රණසිංහ,
අධ්‍යක්ෂ ජනරාල්.

207 ජුනි මස 19 වැනි දින,
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා කාර්යාලය,
අංක 36, මලලසේකර මාවත, කොළඹ 07.

වෙන්දේසියේ විකුණනු ලබන භාණ්ඩ ලැයිස්තුව

| *අයිතමය* | *සංඛ්‍යාව* |
|---|---|
| 01. හෙවිඩියුටි කටු ඇමුණුම් යන්ත්‍ර | 01 |
| 02. කටු ඇමුණුම් යන්ත්‍ර (සාමාන්‍ය) | 10 |
| 03. දුරකථන ලෙදර් ආවරණ | 01 |
| 04. ලෝහ ඉබ්බන් (3/4, 1 1/2, 2 1/4, 2 1/2) | 07 |
| 05. වාහන ඇදීමට ගන්නා කේබල් | 01 |
| 06. ගණක යන්ත්‍ර | 12 |
| 07. ඡායා පිටපත් යන්ත්‍ර (ෂාප්/ නෂුවාටෙක්) | 02 |
| 08. සිදුරු 2 ඡිද්‍රකරණ (පංචර්) | 04 |
| 09. ජංගම දුරකථන (නොකියා/ඇල්කාටල්) | 07 |
| 10. පාපැදි (ලුමාලා) | 01 |
| 11. ලිපිගොනු බන්දේසි | 06 |
| 12. ටයර් .– 13, 15, 16 ප්‍රමාණය | 63 |
| 14 ප්‍රමාණය | 30 |
| 13. වාහන අමතර කොටස් | 200 (කි. ග්‍රෑම්) |
| 14. වායුසමීකරණ යන්ත්‍ර | 03 |
| 15. විදුලි පන්දම් | 02 |
| 16. විදුලි පංකා - බිත්ති | 01 |
| එම - සිවිලින් | 24 |
| එම - පාදස්තල | 06 |
| 17. විදුලි කේතල | 07 |
| 18. මාණ්ඩලික බෑග් | 10 |
| 19. කාන්තා බෑග් | 02 |
| 20. කාමර 3 බෑග් | 06 |

| | අයිතමය | සංඛ්‍යාව |
|---|---|---|
| 21. | පරිගණක මුද්‍රණ යන්ත්‍ර (නෙක්) | 01 |
| 22. | තිර රෙදි | 85 |
| 23. | ලී කැබිනට් (වීදුරු මුහුණත) | 01 |
| 24. | බිත්ති ඔරලෝසු | 01 |
| 25. | කුඩ | 04 |
| 26. | ජැකට් | 01 |
| 27. | රෝනියෝ කඩදාසි පැකට් | 07 |
| 28. | පැන්සල් (නිල්/රතු) | 305 |
| 29. | ටෝනර් (ෂාප්/නෂුවාටෙක්) | 03 |
| 30. | බ්ලැක් නයිලෝන් රිබන් (නෙක්) | 03 |
| 31. | ජංගම දුරකථන බැටර් චාජර් | 04 |
| 32. | පරිඝණක මවුස් | 04 |
| 33. | හිස් ආරක්ෂක ආවරණ (හෙල්මට්) | 05 |
| 34. | අයි. බී. එම්. පරිඝණක යතුරු පුවරු | 01 |
| 35. | ඇමතුම් සීනු | 01 |
| 36. | උද්‍යාන අලංකරණ ලාම්පු | 16 |
| 37. | ලී පෙට්ටි | 02 |
| 38. | ජනේලය (පියන් සහිත) | 01 |
| 39. | දොර පියන් | 04 |
| 40. | කොමඩ් (සිස්ටන් සමග) | 07 |
| | සින්ක් (පිහල් මැටි) | 01 |
| 41. | පරිඝණක සී. පී. යූ | 01 |
| 42. | යතුරු ලියන - විදුලි | 01 |
| | එම - සිංහල | 03 |
| | එම - ඉංග්‍රීසි | 04 |
| 43. | චීප් බෝඩ් | 04 |
| 44. | පරිඝණක (උපාංග සහිත) | 01 |
| 45. | හදිසි අවස්ථා (ඉමර්ජන්සි) ලාම්පු | 01 |
| 46. | ශීතකරණ | 01 |
| 47. | පුටු (වානේ/කුෂන්) | 01 |
| 48. | වානේ සාමාන්‍ය පුටු | 05 |
| 49. | ලී කුෂන් පුටු | 01 |
| 50. | සාමාන්‍ය පුටු | 03 |
| 51. | ඇඳි පුටු | 21 |
| 52. | යතුරු ලියන පුටු | 04 |
| 53. | ලිපිකරු මේස | 09 |
| 54. | ලොකු මේස | 02 |
| 55. | වානේ කබඩ් - ලාච්චු 4 | 02 |
| 56. | වානේ කබඩ් - ලාච්චු 2 | 01 |
| 57. | ඇලුමිනියම් කැබලි | 05 (කි. ග්‍රෑම්) |
| 58. | ලී කැබලි | 50 (කි. ග්‍රෑම්) |
| 59. | වැන් රථ ෂීට් | 08 |
| 60. | යතුරු පැදි - සුසුකි ජී. එස්. 125 (142 කාණ්ඩය) | 02 |

07-101

---

## මහාධිකරණය - හලාවත

හලාවත මහාධිකරණය අලුත්වැඩියාවෙන් පසු ඉවත් කළ ලී උපකරණ හා අබලි ද්‍රව්‍ය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙහි පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ 2007.07.26 වැනි බ්‍රහස්පතින්දා ප.ව. 2.00 ට හලාවත මහාධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය පවත්වන දින ප.ව. 1.30 සිට 2.00 දක්වා අදාළ භාණ්ඩ පරීක්ෂා කළ හැකිය.

03. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව පිලිනොගන්නා අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

04. වෙන්දේසියේදී මිලදී ගන්නා භාණ්ඩ එම අවස්ථාවේදි ම මුදලින් ගෙවීම් කළ යුතුය. මුදල් ඇණවුම්, චෙක්පත් භාර නොගන්නා අතර එදින පස්වරු 6.00ට ප්‍රථම සියළුම භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුවේ.

05. වෙන්දේසියේ දී භාණ්ඩ මිලදී ගන්නන් විසින් තමන්ගේ අනන්‍යතාවය ජාතික හැඳුනම්පත හෝ ඒ සමාන ලියවිල්ලකින් තහවුරු කළ යුතුය.

එම්. සී. ජේ. මඩවල,
වයඹ පළාතේ මහාධිකරණ විනිසුරු,
මහාධිකරණය - හලාවත.

2007 ජුනි මස 12 වැනි දින,
හලාවත මහාධිකරණයේ දී ය.

### උපලේඛනය

| අනු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය |
|---|---|
| 01 | අඩි 6.2 x 1.7 දැල් සහිත දොර පියන් 2 යි |
| 02 | අඩි 3 x 2" . 3" දැල් කැලි 22 යි. |
| 03 | දිග අඩි 10.6'' x 2.3'' දැල්කැලි 01 යි. |
| 04 | පොත් රාක්ක දිග අඩි 11.5 x 3.3 x 4.6 04 යි. |
| 05 | දිග අඩි 11 1.6 x 7 පොත් රාක්ක 1 යි (තරමක් දිරා ඇත) |
| 06 | දිග අඩි 16 1/2 මුල විශ්කම්භය අඩි 4 යි. අග විශ්කම්භය 2.6 ඉන්දියන් විලෝ ගස් කඳන් 01 යි. |
| 07 | උඩට වීදුරු ගැසූ අඩි 5.10'' x 5.6'' පාටිෂන් රාමු 01 යි. |
| 08 | උඩට වීදුරු ගැසූ අඩි 3.6'' x 5.10'' පාටිෂන් රාමු 01 යි. (දැව දිරා ඇත) |
| 09 | සිරමැදිරි (ප්‍රාථමික අධිකරණය - වෙන්නප්පුව) 01 යි. |
| 10 | සාක්ෂි කූඩු එම 01 යි. |
| 11 | විනිශ්චයාසනය එම 01 යි. |
| 12 | දිග අඩි 10' . 9'' පළල අඩි 2'.6'' උස අඩි 5'.4'' අබලන් රාක්ක 01 යි. |
| 13 | දිග අඩි 10 ' .9'' පළල අඩි 2'.6'' උස අඩි 5'.4'' අබලන් රාක්ක 01 යි. |
| 14 | දිග අඩි 10'.9 පළල අඩි 2'.6'' උස අඩි 5'.4'' අබලන් රාක්ක 01 යි. |
| 15 | දිග අඩි 10'.9'' පළල අඩි 2'.6'' උස අඩි 5'.4'' අබලන් රාක්ක 01 යි. |
| 16 | දිග අඩි 10'.9'' පළල අඩි 2'.6'' අබලන් රාක්ක 01 යි. |
| 17 | දිග අඩි 10''.9'' පළල අඩි 2'.6'' උඩ අඩි 5'.4'' අබලන් රාක්ක 01යි. |
| 18 | 8' x 3' දිරාගිය තහඩු 3 යි. |

07-02

---

## දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - තංගල්ල

තංගල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරනු ලැබූ මෙතෙක් හිමිකම් නොකියන ලද විකුණා මුදල් රජයට බැර කිරීමට නියමිතව ඇති පහත සඳහන් ද්‍රව්‍ය 2007.08.11 වැනි දින පෙ. ව. 10.00 ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් වන කිසියම් ද්‍රව්‍යයක් පිළිබඳ හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතුය.

03. රෙජිස්ට්‍රාර් වරයාගේ අවසරය ලබාගෙන වෙන්දේසිය ආරම්භ කිරීමට පැයකට ප්‍රථම වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ එවෙලේ ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

06. භාණ්ඩ මිලදී ගන්නා පුද්ගලයන් තම ජාතික හැඳුනුම්පත් අනිවාර්යයෙන්ම රැගෙන පැමිණිය යුතුය.

තාමර තෙන්නකෝන්,
දිසා විනිසුරු සහ මහෙස්ත්‍රාත්,
තංගල්ල.

2007 ජුනි මස 13 වැනි දින,
තංගල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### භාණ්ඩ පිළිබඳ විස්තරය

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | ඒ. ආර්. 549/05 | අලු පැහැති "පීනි" වර්ගයේ ඉදිරිපස කූඩයක් සහිත තැලී ඇති පාපැදි | 01 |
| 02. | ඒ. ආර්. 293/06 | අංකය අපැහැදිලි කොළපාට ප්‍රේම් එක සහිත පාපැදි | 01 |
| 03. | ඒ. ආර්. 293/06 | අංක 158029 දරන පාපැදි | 01 |
| 04. | ඒ. ආර්. 293/06 | අංක ඊ. එන්. එෆ්. 15126 දරන පාපැදි | 01 |
| 05. | ඒ. ආර්. 293/06 | අංකය අපැහැදිලි රතුපාට ප්ලාස්ටික් මඩ්ගාඩ් එක සහිත නිල්පාට ප්‍රේම් එක සහිත පාපැදි | 01 |
| 06. | ඒ. ආර්. 334/06 | වර්ගය අපැහැදිලි, මල බැඳී ඇති ලගේජය සහිත පාපැදි | 01 |
| 07. | ඒ. ආර්. 368/06 | අංක 67319930 දරන ලුමාලා වර්ගයේ කලුපාට පාපැදි | 01 |
| 08. | ඒ. ආර්. 490/06 | නිල්පාට හා අලුපාට, අංක බී. සී. 08461468 දරන මවුන්ටන් වර්ගයේ මඩ්ගාඩ් රහිත පාපැදි | 01 |
| 09. | ඒ. ආර්. 626/06 | අංක 228050 දරන සිංගර් වර්ගයේ පාපැදි | 01 |
| 10. | ඒ. ආර්. 367/06 | අංකය හා වර්ණය අපැහැදිලි නිල්පාට පාපැදි | 01 |
| 11. | අංක රහිත | පිටුපස රෝදය ගැලවී ගැටගසා ඇති දිරාපත් පාපැදි | 01 |
| 12. | එම | පිටුපස රෝදය ගැලවී ඇති දිරාපත් පාපැදි | 01 |
| 13. | එම | ලොකු ලගේජය සහිත දිරාපත් පාපැදි | 01 |
| 14. | එම | අංක ආර්. 108333 දරන රැලේ වර්ගයට අයත් පැටල් කූරු දෙක පමණක් ඇති කලුපාට, දිරාපත් පා පැදි | 01 |
| 15. | එම | දිරාපත් පාපැදි | 01 |
| 16. | එම | මඩ්ගාඩ්, චේන්කේස් රහිත දිරාපත් පාපැදි | 01 |
| 17. | එම | "මොණරා" සඳහන් අංක රහිත දිරාපත් පාපැදි | 01 |
| 18. | එම | ලොකු ලගේජය, ලොක් එක සහිත දිරාපත් පාපැදි | 01 |
| 19. | එම | පැටල් කූරු දෙක පමණක් ඇති ලොකු ලගේජය සහිත ලොක් කරන ලද පාපැදි | 01 |
| 20. | එම | "රෂ් 99" සඳහන් දිරාපත් පාපැදි | 01 |
| 21. | එම | ලොකු ලගේජය සහිත "එවොන්" වර්ගයේ දිරාපත් පාපැදි | 01 |
| 22. | එම | රෝද දෙක තැලීගිය අබලන් පාපැදි | 01 |
| 23. | 88266 | ප්ලාස්ටික් ජලකරාම | 01 |
| 24. | 88268 | ප්ලාස්ටික් ජලකරාම | 01 |
| 25. | 89385 | ප්ලාස්ටික් ජලකරාම | 01 |
| 26. | 89381 | ප්ලාස්ටික් ජලකරාම | 01 |
| 27. | 89056 | (i) ලීටරය ප්‍රමාණයේ මිනුම්උපකරණ | 01 |
| | | (ii) රතුපාට ප්ලාස්ටික් පුනීල | 01 |
| 28. | 89265 | (i) ලීටරය ප්‍රමාණයේ මිනුම් උපකරණ | 01 |
| | | (ii) නිල්පාට ප්ලාස්ටික් පුනීල | 01 |
| 29. | 89114 | කම්බිඇණ ග්‍රෑම් | 200 |
| 30. | 89383 | අහල් 2 ඇණ ග්‍රෑම් | 200 |
| 31. | 89375 | චීත්තරෙදි මීටර් | 01 |
| 32. | 89386 | (i) පොප්ලින් සුදු රෙදි මීටර් | 01 |
| | | (ii) පොප්ලින් සුදු රෙදි මීටර් | 1.79 |
| 33. | 89380 | සෙ. මී. 45 ක චීත්ත රෙදි කැබලි | 01 |
| 34. | 89377 | අත්ලේන්සු | 01 |
| 35. | 90962 | කැතිතල | 01 |
| 36. | 90291 | සවල් | 01 |
| 37. | 90364 | වයර් රෝල් | 01 |
| 38. | 90901 | වේවැල් කූඩ | 01 |
| 39. | 90902 | වේවැල් කූඩ | 01 |
| 40. | 90933 | කොස් දර ට්‍රේලර් 01 ක් පමණ | |
| 41. | අංක රහිත | හිස් ප්ලාස්ටික් කෑන් සහ බූලි තොගයක් | |
| 42. | එම | විවිධ ප්‍රමාණයේ සහ විවිධ වර්ගයේ හිස් බෝතල් තොගයක් | |
| 43. | එම | දිරාපත් වෙමින් පවතින යකඩ කැබලි තොගයක් | |
| 44. | එම | 1. ගොඩනැගිලි අලුත්වැඩියාවේ දී ඉවත් කරන ලද දිරාපත් සිවිලන් ෆෑන් | 01 |
| | | 2. සිවිලින් ෆෑන් පුලි | 04 |
| | | 3. පිහන් ගඩොල් සින්ක් | 01 |
| 45. | එම | අංක එස්. පී. එච්. වී. 2806 දරන යන්වාර් වර්ගයේ අත්ට්‍රැක්ටරය (ට්‍රේලරය සමග) | |
| 46. | 81851 | 1. සෝනි වර්ගයේ බෆල් | 01 |
| | | 2. රවුම් වේවැල් පුටු | 02 |
| | | 3. අහල් 32 ක් වූ එල්. ජී. වර්ගයේ ලාකොළ පාට ශීතකරණ | 01 |
| | | 4. වේවැලින් ගෙතූ සනීප පිටු (ලී වලින් සාදා ඇත) | 01 |
| | | 5. නිල් රෙද්දක් ගසා, ලී වල සුදුපාට තීන්ත ආලේප කල සනීප පුටු | 01 |
| | | 6. කකුල් කැඩී ගිය කුඩා ලී ඇඳන් | 01 |
| | | 7. කබඩ් දොරපලු | 01 |
| 47. | 81853 | 1. රවුම් කුඩා ස්ටූල් | 01 |
| | | 2. රෝද සහිත නිල්පාට ගමන් මලු | 01 |
| | | 3. කලුපාට ලෙදර් බෑග් | 01 |
| | | 4. රවුම් වේවැල් පුටු | 02 |
| | | 5. ලීටර් 2000 ධාරිතාව ඇති ඩයින වර්ගයේ කලුපාට වතුර ටැංකි | 01 |
| | | 6. උස අහල් 32 ක් වූ එල්. ජී. වර්ගයේ ලාකොළ පාට ශීතකරණ | 01 |
| | | 7. ජේ. වී. සී. වර්ගයේ බෆල් | 01 |
| | | 8. ලා කොළ පාට රෝස්ටර් | 01 |
| | | 9. සුදුපාට කුඩා රවුම් බූලි | 01 |
| | | 10. නිල්පාට ප්ලාස්ටික් පුටු | 02 |
| | | 11. කොළපාට වීදුරුබෝල | 01 |
| | | 12. කකුල් දෙකක් කැඩුනු මේස | 01 |
| | | 13. ප්ලයිවුඩ් වර්ගයේ දොර පලු | 02 |
| | | 14. සෝනි වර්ගයේ බෆල් | 01 |
| 48. | 81855 | කලුපාට කවරයක් සහිත අංක 3541336 දරන පෙන්ටෙක්ස් වර්ගයේ කැමරා | 01 |
| 49. | 81856 | 1. වේවැල් පුටු | 01 |
| | | 2. කකුල් තුනක ස්ටූල් එකක යට කොටස් | 01 |
| | | 3. රවුම් ස්ටූල් ලෑලි | 01 |
| | | 4. පියුස් බෝඩ් | 01 |
| | | 5. කොළ, කලුපාට කවරයක් සහිත මෙට්ට | 01 |
| 50. | 81857 | 1. ඇඳ ඉහ | 02 |
| | | 2. රවුම් මේස | 01 |
| 51. | 82688 | 1. නිල්පාට බ්‍රිෆ් කේස් | 01 |
| | | 2. පාට කරන ලද යක් මුණු | 08 |
| | | 3. පාට කරන ලද යක් ඇඳුම් | 11 |
| | | 4. හම් ගෙජ්ජි සළඹ | 04 |
| | | 5. ගෝනි ඇඳුම් | 02 |
| 52. | 82689 | උස අඩි 2 අහල් 7 1/2ක් ද, පළල අඩි 1 1/2ක් ද වූ සුදු පැහැති ශීතකරණ (නමක් නැති) | 01 |
| 53. | 82691 | 1. උස අඩි 4ක් වූ, ලා කොළපාට ඉදිරිදොර කැඩී ගිය ශීතකරණ | 01 |
| | | 2. සුදු පාට, අඩි 4ක් උස ශීතකරණ දොර | 01 |
| | | 3. කොකාකෝලා රතුපාට හිස් කේස් | 01 |
| | | 4. වේවැල් හාන්සි පුටු | 02 |
| 54. | 82692 | 1. කැඩී ගිය ලී ඇඳක හිස කොටස් | 01 |
| | | 2. කැඩී ගිය රවුම් ලී මේසයක කකුල් කොටස් | 01 |
| | | 3. රතුපාට, කොකාකෝලා හිස් කේස් | 01 |
| 55. | 82693 | 1. කැඩී ගිය අලුපාට බ්‍රිෆ් කේස් | 01 |
| | | 2. අලුපාට ජර්සි | 01 |
| | | 3. සුදු පාට ටී ෂර්ට් | 01 |
| | | 4. නිල්පාට ඩෙනිම් කලිසම් | 01 |

07-96

---

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

### බිස්නස්මේට් ප්‍රයිවට් ලිමිටඩ්

2007 අංක 07 දරන සමාගම් ආඥා පනතේ අංක 9 වැනි වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනයයි

සමාගමේ නම - එක්ස්පෙරිමන්ට්ස් ප්‍රයිවට් ලිමිටඩ්

සමාගමේ අංකය - ජී. වී. 60096 දාතම 2007.05.29

සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය - අංක 45, බ්‍රේබෲක් වීදිය, කොළඹ 02.

ලේකම්වරු,

අංක 45, බ්‍රේබෲක් වීදිය,
කොළඹ 02.
2007 ජුනි මස 06 වැනි දින.

07-49/1

### බිස්නස්මේට් ප්‍රයිවට් ලිමිටඩ්

2007 අංක 07 දරන සමාගම් ආඥා පනතේ අංක 09 වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනයයි

සමාගමේ නම - මන්දාකිණි ක්‍රියේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගමේ අංකය - ජී. වී. 60174 දාතම 2007.06.06

සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය -අංක 830, රොහින මාවත, පැලවත්ත, බත්තරමුල්ල.

ලේකම්වරු,

අංක 45, බ්‍රේබෲක් වීදිය,
කොළඹ 02.
2007 ජුනි මස 07 වැනි දින.

07-49/3

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

No. 36, Swanage Waye Hayes Middlesex UB4 ONY United Kingdom යන ලිපිනයේ පදිංචිව සිට දැනට කුරුණෑගල නුවර පාරේ අංක 331/6 දරන නිවසේ පදිංචිව සිටිනා මොහොමඩ් කාසින් මොහොමඩ් නසීර් (පු. හැ. අ. 570413465 V) වන මා මාතලේ කුමාර වීදියේ අංක 39 දරන ලිපිනයේ පදිංචි මොහොමඩ් හාෂිම් මොහොමඩ් අබුබක්කර් (පු. හැ. අ. 551014410V) නමැති අයට No. 12, Old Square Lincoln's Inn LONDON WC 2A3TX යන ලිපිනයේ පදිංචි නීතිඥ එෆ්. එස්. සී. කෝදාගොඩ මහතා විසින් 2002.05.10 වැනි දින සහතික කර ඇටෝර්නි බලපත්‍ර පොතේ 237 වන කාණ්ඩයේ අංක 165 දරන පත් ඉරුවේ 4557 දරන දිනපොත් අංකය යටතේ ලියාපදිංචි කරමින් ලබාදී ඇති ඇටෝර්නි බලපත්‍රය අද දින සිට අවලංගු කර බල රහිත කර ඇති බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මින් දන්වා සිටිමි.

07-50

### බිස්නස්මේට් ප්‍රයිවට් ලිමිටඩ්

2007 අංක 07 දරන සමාගම් ආඥ පනතේ අංක 9 වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනයයි

සමාගමේ නම - ජේ. ඩී. ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගමේ අංකය - ජී. වී. 60138 දාතම 2007.06.05

සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය-ගල්කඩේ හංදිය, අළුත්ගම, බණ්ඩාරගම.

ලේකම්වරු,

අංක 45, බ්‍රේබෲක් වීදිය,
කොළඹ 02.
2007 ජුනි මස 06 වැනි දින.

07-49/2

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරන දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පහත සඳහන් සමාගම 2007. 05.21 වැනි දින සංස්ථාපනය කරන ලද බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම –සීමාසහිත රිලයන්ස් ඇසෝසියේට්ස් (ප්‍රයිවෙට්)

සමාගමේ අංකය - පී.වී. 60025

ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 09, අපොන්සු මාවත, ලක්ෂපතිය මොරටුව

ලේකම්,
සීමාසහිත රිලයන්ස් ඇසෝසියේට්ස් (ප්‍රයිවෙට්)
පී. වී. 60025.

07 – 85

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : ස්ජීඩ්මාක් ආරක්ෂක සේවා (පුද්) සමාගම

ලියාපදිංචි අංකය : ජී.වී.– 60111

ලියාපදිංචි ලිපිනය : 180/C කළපළුවාව, රාජගිරිය

ලියාපදිංචි කල දිනය : 2007.05.30

අධ්‍යක්ෂ : ඒ. එස්. අමරසිංහ

07-128

### දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් ආඥා පනතට අනුකූලව පහත සඳහන් සමාගම් සංස්ථාගත කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| *සමාගමේ නම* | *ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය* | *සංස්ථාගත අංකය* |
|---|---|---|
| 1. ඔෂන් මර්කස්ටයිල් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 08, ඒ, ඩීල් පෙදෙස, කොළඹ 03. | පී. වී. 60234 |
| 2. වින්ඩ් මර්කන්ටයිල් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 08, ඩීල් පෙදෙස, කොළඹ 03 | පී. වී. 60228 |
| 3. හන්සි මර්කන්ටයිල් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 188, පහළවෙල පාර, තලංගම දකුණ. | පී. වී. 60233 |

ක්‍රරයිට්‍රරියා මැනේජ්මන්ට් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සෙකට්‍රීස් (ලේකම්වරු)

2007 ක්වූ ජුනි මස 19 වන දීය.

07-92

### ප්‍රසිද්ධ දැන්වීමයි

සමාගම් ආඥාපනතේ (2007 අංක 07) සංස්ථාපිත කරනු ලැබූ නේචර් සොලූෂන් ප්‍රොවයිඩර්ස් (පුද්ගලික) සමාගම සංස්ථාපිත කිරීම.- 2007 මැයි 28 වැනි සමාගම් ආඥා පනතේ (2007 අංක 07) අංක 9 (1) වගන්තිය යටතේ ප්‍රසිද්ධ දැන්වීම මත නම, සමාගමේ අංකය සහ ලියාපදිංචි සමාගම් කාර්යාලයේ ලිපිනය දක්වා තිබේ.

සමාගමේ නම.–නේචර් සොලූෂන් ප්‍රොවයිඩර්ස් (පුද්ගලික) සමාගම

සමාගම් අංකය.–පී වී 60075

සමාගම් ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය.–අංක 94, උඩුපිල, දෙල්ගොඩ.

නේචර් සොලූෂන් ප්‍රොවයිඩර්ස් (පුද්ගලික) සමාගම
අධ්‍යක්ෂක

ජුනි 2007

07-137

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - හැටන් ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූද සී/සහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දා වූද 2005.12.06 වන දින සහ අංක 780 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සිල්වෙස්ටර් ක්‍රිශාන් *හෙවත්* සිල්වෙස්ටර් සෙබස්තියන් ක්‍රිශාන් නඩරාජා නවරත්නම් සහ ඇන්ටන් රොනල්ඩ් සෙබස්තියන් ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින්,

සී/සහිත හැටන් නැෂනල් බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියළු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල 2007 ජුලි මස 25 වන දින පෙ.ව. 11.00 ට ඇරඹෙන පරිදි දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ලේකම් කොට්ඨාශයේ, ඔය පළාත කෝරළේ, නුවරඑළිය නගර සභා සීමාව තුළ නේස්බයි වතුයායේ පිහිටි "නේස්බයි වත්ත" නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක එච්. එම්. සමරනායක විසින් මැන සාදන ලද 2005.03.10 දිනැති අංක 4986 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 දරන නිරූපිත ඉඩම් කොටස (එම ඉඩම බලයලත් මානක පී. වික්‍රමසිංහ විසින් සාදන ලද 1996 ජනවාරි 19 දිනැති අංක 3198 දරන පිඹුරේ ලොට් 1 දරන කොටසකින් නැවත මැන සාදන ලද්දකි.) සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි හා සියළු දේත් සමග වේ.

විශාලත්වය: රූඩ් 1 යි පර්චස් 35 යි.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2007.05.18 දින දරන රජයේ *ගැසට් පත්‍රය* හා 2007.05.28 වන දින අයිලන්ඩ්. දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියය (රු. 500) ක් ද,
5. සියළුම ප්‍රචාරක වියදම්,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහ (රු. 2000) ක් ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක්වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත සී/සහිත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුලත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ප්‍රධාන කළමනාකරු (ණය අයකිරීම්), සී/සහිත හැටන් නැෂනල් බැංකුව, අංක 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10.

දුරකථන අංක: 2661815, 2661816 ගෙන් ලබාගත හැක.

එන්. එච්. පී. එෆ්. ආරියරත්න,
උසාවි කොමසාරිස් හා බලයලත් වෙන්දේසිකරු,

අංක 34/31, සහ 32,
නීතිඥ කාර්යාල සංකීර්ණය,
කොළඹ 12.

07-135/1

---

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0104401286.

ණයකරුගේ සම්පූර්ණ නම : කොන්තිගොඩ කංකානන්ගේ සජීව විරාජ් සහ ලලනි චම්පිකා ශ්‍රී ජලයත්.

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2005.05.06 වන දින අංක 1392 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2005.05.09 වන දින "ලක්බිම", "ද අයිලන්ඩ්", "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ, අංක 228/ඒ, වලව්වත්ත, කැස්බෑව ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ඒ. එස්. ලියනගේ මයා විසින් 2007.07.26 වන දින පෙ. ව. 10.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් පන්ලක්ෂ දාහතර දහස් හැට පහයි ශත අසූ හයක් (රු. 5,14,065.86) මුදලක් වර්ෂ 2004.07.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හාරලක්ෂ හැටඑක් දහස් එකසිය නවයයි ශත තිස් හතරක (රු. 4,61,109.34) මුදල ද, 2004.07.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් පනස් දෙදහස් නවසිය පනස්හයයි ශත පනස් දෙකක් (රු. 52,956.52) වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් පන්ලක්ෂ දාහතර දහස් හැට පහයි ශත අසූ හයක් (රු. 5,14,065.86) ද,

(2) එකී රුපියල් හාරලක්ෂ හැටඑක් දහස් එකසිය නවයයි ශත තිස් හතරක (රු. 4,61,109.34) මුදල මත අයවිය යුතු වර්ෂයකට 14.5% බැගින් වන පොළියක් 2004.08.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේපත්තුවේ, සල්පිටි කෝරළේ, මොරටුව නගර සභා සීමාවේ විල්ලෝරාවත්ත ග්‍රාමයේ ශාන්ත චාල්ස් පාරේ, වරිපනම් අංක 34හි පිහිටි ගල්වැටියාවත්ත සහ මිල්ලගහවත්ත නැමැති ඉඩමට 2000.11.29 දින එම්. එම්. කුරේ මානක තැන විසින් මැන සම්පාදිත අංක 2490 පිඹුර ප්‍රකාර ලොට් 1ට මායිම්, උතුරට: ශාන්ත චාල්ස් පටුමහ ද ; නැගෙනහිරට : පිඹුරු අංක 3614හි කැබලි අංක ඒ සහ ඇනී එනල්තිනා ප්‍රනාන්දුගේ ඉඩම ද ; දකුණට : කැබලි අංක 3 සහ 2 ද ; බටහිරට: කැබලි අංක එෆ් (අඩි 10 පළල මාර්ග රක්ෂිතය) ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහයයි දශම අටයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 10.80) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවය ද සමහ ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2555/22හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2007 ක් වූ ජුනි මස 22 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරි.

07-116

---

### මහජන බැංකුව - සුදුවැල්ල ශාඛාව

1986 අංක 32 දරන පනත විසින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී කොටස යටතේ වෙන්දේසි කිරීම

#### වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ, මරදානෙහි පිහිටි, බලයලත් මිනින්දෝරු සිරි ඩී. ලියනසූරිය මහතා විසින් 1982.08.03 දාතමින් යුතු අංක 2563 පිඹුරු පතෙහි දක්වන ලද ලොට් අංක 1 ලෙස සලකුණු කරන ලද බිම් කොටසේ වෙන් කර සහතික කරන ලද සියල්ල මරදාන, අංක 26 නගර සභා බල ප්‍රදේශය, දේවානම්පියතිස්ස මාවත, අංක 153 දරන තක්සේරුව පවත්නා ප්‍රමාණය ලොට් අංක 1- අක්. 0 රූඩ් 0 පර්. 6.95 එහි පවත්නා සියල්ල සහිතව මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ 2007 ජූලි මස 26 වැනි දින (බ්‍රහස්පතින්දා) පෙරවරු 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

තීරණය පිළිබඳ දැන්වීම සඳහා 1998.06.05 *රජයේ ගැසට් පත්‍රයද,* 1998.05.21 පුවත් පත් (දිනමිණ, ඩේලිනිව්ස් සහ තිනකරන්) ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.–* මිළ තින්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිළෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
5. වෙන්දේසි පිරිවැය සහ වෙනත් අය කිරීම් වෙතොත්,
6. වෙන්දේසි සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත සහකාර සාමාන්‍යාධිකාරි, මහජන බැංකුව, කලාප මූලස්ථානය, (බටහිර 1), අංක 11, ඩියුක් වීදිය, කොළඹ 1 වෙත ගෙවිය යුතු වේ.

දුරකථන අංක : 2387068, 2344983.

යථොක්ත ලිපිනයෙන් අදාළ ඔප්පු සහ අනෙකුත් විස්තර ලබා ගත හැකිය. ඉහත සඳහන් කළ පරිදි දින 30ක් ඇතුළත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනට ම ගෙවනු ලැබ ඇති විකුණුම් මිළෙන් 10% බැංකුව සන්තක කිරීමේ සහ දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතු වේ.

ෂොක්මන් සහ සමරවික්‍රම,
**ISO** 9001 : 2000 සහතිකය ලත්, ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ,
පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ, උපදේශක
තක්සේරුකරුවෝ සහ ඉඩම් අලෙවි නියෝජිතයෝ.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංක : 081-2227593,
දුරකථන/ෆැක්ස් : 081-2224371,
ඊමේල් : schokmankandy@sltnet.lk.

*නගර කාර්යාලය:*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 5
දුරකථන අංක : 011-2502680, 2585408,
දුරකථන/ෆැක්ස් : 011- 2588176,
ඊමේල් : schokman@sameral 1982com.

07-99

---

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 2500001443.

ණයකරුගේ සම්පූර්ණ නම : කුඩා දුරයලාගේ ප්‍රයන්ත කුමාර සහ කුඩා දුරයලාගේ රංජිත්

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2006.08.04 වන දින අංක 1454 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2006.08.08 වන දින "ද අයිලන්ඩ්",සහ "තිනක්කුරල්" පුවත්පත්වල ද වර්ෂ 2006.08.09 දින "ලක්බිම", පුවත්පතේ ද පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ, අංක 28, නව කාර්යාල සංකීර්ණය, කුමාරතුංග මාවත, කුරුණෑගල ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ඩබ්ලිව්. එම්. අයි. ගල්ලැල්ල මයා විසින් 2007.07.24 වන දින පෙ. ව. 11.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ විසි අට දහස් හත්සිය හතලිස් නවයයි ශත දහඅටක් (රු. 2,28,749.18) මුදලක් වර්ෂ 2005.08.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ අසූහත් දහස් හාරසිය එකොලහයි ශත හැත්තෑ හයක (රු. 1,87,411.76) මුදල ද, 2005.08.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් හතලිස් එක් දහස් තුන්සිය තිස් හතයි ශත හතලිස් දෙකක් (රු. 41,337.42) වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ විසි අට දහස් හත්සිය හතලිස් නවයයි ශත දහඅටක් (රු. 2,28,749.18) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ අසූහත් දහස් හාරසිය එකොලහයි ශත හැත්තෑ හයක (රු. 1,87,411.76) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.90% බැගින් වන පොළියක් 2005.09.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

#### උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, පරණකුරු කෝරළේ, මාවත පත්තුවේ, කෑගල්ල නගර සභා සීමාවේ, පිටිහුම ග්‍රාමයෙහි බෙලිගස් පාරේ , වරිපනම් අංක 96/03 හි පිහිටි පිටිගෙතැන්නවත්ත නැමැති ඉඩමට 2002.01.24, 2002.03.06 දින ටී. එන්. කාදර් මානක තැන විසින් මැන සම්පාදිත අංක 4230 ඒ පිඹුර ප්‍රකාර ලොට් 01ට මායිම් උතුරට: නිවෙස්වල සිට බෙලිගස් පාර දක්වා දිවෙන නගර සභා පාර (අංක පී. පී. කෑ. 1809 පිඹුරෙහි ලොට් 12) ද ; නැගෙනහිරට : අංක පී. පී. කෑ. 1809 පිඹුරෙහි කැබලි අංක 13 ද, ; දකුණට : නිවෙස්වල සිට බෙලිගස් පාර දක්වා දිවෙන පාරක් ද ; බටහිරට: අංක පී. පී. කෑ. 1809 පිඹුරෙහි කැබලි අංක 15 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් විසිඑකයි දශම පහක (අක්. 0 රූඩ් 0 පර්. 21.5) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේ ද මාර්ග පරවශතාවය ද සමග කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කෑ. 13/36 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2007ක් වූ ජුනි මස 22 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරි.

07-114

---

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 1800001025.

ණයකරුගේ සම්පූර්ණ නම : අතුකෝරලලාගේ චන්ද්‍රරත්න.

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2003.11.14 වන දින අංක 1315 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2003.11.18 වන දින "දිනමිණ", "ද අයිලන්ඩ්", "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ, අංක 28, නව කාර්යාල සංකීර්ණය, කුමාරතුංග මාවත, කුරුණෑගල ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ඩබ්ලිව්. එම්. අයි. ගල්ලැල්ල මයා විසින් 2007.07.25 වන දින පෙ. ව. 11.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ හතලිස් එක් දහස් හතලිස් හතරයි ශත හතලිස් එකක් (රු. 2,41,044.41) මුදලක් වර්ෂ 2003.02.28 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ අනූහත් දහස් පන්සිය හැට නමයයි ශත හැත්තෑ දෙකක (රු. 1,97,569.72) මුදල ද, 2003.02.28 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් හතලිස් තුන් දහස් හාරසිය හැත්තෑ හතරයි ශත හැට නවයක් (රු. 43,474.69) වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ හතලිස් එක් දහස් හතලිස් හතරයි ශත හතලිස් එකක් (රු. 2,41,044.41)ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ අනූහත් දහස් පන්සිය හැට නවයයි ශත හැත්තෑ දෙකක (රු. 1,97,569.72) මුදල මත අයවිය යුතු වර්ෂයකට 13.90% බැගින් වන පොළියක් 2003.03.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

#### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, උතුරු යටිකහ කෝරලේ කටුගම්පොල හත්පත්තුවේ පඩුවස්නුවර ප්‍රාදේශිය සභා සීමාවේ බෝධිමුල්ල ග්‍රාමයේ හි පිහිටි ගල්ගොඩයායේහේන නැමැති ඉඩමට 1998.06.02 දින ආර්. බී. නවරත්න මානක තැන විසින් මැන සම්පාදිත අංක 3747 පිඹුර ප්‍රකාර ලොට් 02 ට මායිම්, උතුරට: එච්. ඒ. කමලා හපුආරච්චිගේ ඉඩමේ ඉම හා ප්‍රාදේශීය සභා පාර ද ; නැගෙනහිරට : එන්. එම්. නිමල් ආනන්දගේ ඉඩම වෙන් වන ඉඩම ද ; දකුණට : එම්. එම්. විමලාවතීගේ ඉඩම ද, එන්. එම්. නිමල් ආනන්දගේ ඉඩම ද ; බටහිරට:ලොට් 1 වෙන් වන ඉඩම ද, යන

මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් විසිහයක් (අක්. 0 රූ. 2, පර්. 26) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේ ද සමග කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජේ 110/253 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2007ක් වූ ජූනි මස 22 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

07-117

---

## මහජන බැංකුව - ආනමඩුව ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

ආඩිගම, පහල කඩයන්දළුව ග්‍රාමයේ පිහිටි පදිංචියට සුදුසු වටිනා දේපළ, විශාලත්වය පර්චස් 35.62.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2007.07.30 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ මවිසින් විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2004.12.03 දින ද, දිනමිණ, ඩේලිනිව්ස්, තිනකරන් පුවත්පත් වල 2004.11.23 දින පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*– හලාවත, ආණමඩුව මාර්ගයේ ආඩිගම සිට නිකවැරටිය පාරේ යන විට හමුවන ෆවුසි මාවතේ තවත් සැතපුම් 02ක් ගිය තැන හමුවන මදවක්කුලම, මුස්ලිම් පල්ලිය පසු කරන විට හමුවන වංගුවේ අදාල දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිළෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිළෙන් 2 1/2%ක්,
4. ලිපිකරු සහ නිවේදකයේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිළෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත නාත්තන්ඩියේ පිහිටි, මහජන බැංකුව, හලාවත ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමණාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක : 032-2253301, 032-2253300

ෆැක්ස් අංකය : 032-2255247

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්. පී. සී. පෙරේරා,
බලයලත් වෙන්දේසිකරු තක්සේරුකරු
සහ උසාවි කොමසාරිස්.

අංක 22, ප්‍රනාන්දු මාවත,
මීගමුව.
දුරකථන අංකය : 031-2223219.

07-72

---

## මහජන බැංකුව - බොරැල්ල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මා වෙත පවරන ලද බලය පරිදි වෙන්දේසියේ විකිණීම

**ශ්‍රී ලංකා රබර් ප්‍රොඩක්ට්ස් එක්ස්පෝට් කෝපරේෂන් මාවනැල්ල (ප්‍රයිවෙට්) ලිමිටඩ් දැවැන්ත වෙන්දේසිය**

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගලබොඩ කෝරලේ, ගලබොඩ පත්තු ඩී. ආර්. ඕ. කොට්ඨාසයේ රන්කොත්දිවෙල කොට්ඨාශය අංක 03, මාවනැල්ල සුළු නගර සභා සීමාව තුළ නුන්ගොමුව ග්‍රාමයේ පිහිටි නුන්ගොමුව පාරේ වරිපනම් අංක 15/16 සහ 15/17 දරන "යග්ගලේවත්ත" නමැති ඉඩමෙන් මිනුම්පති වෙනුවෙන් සබරගමුව කොට්ඨාශයේ මිනුම් කොමසාරිස් විසින් සාදන ලද 1972 මාර්තු 6 දාතම හා අංක 578 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට දක්වා ඇති අගනා සම්පූර්ණ බිම් කොටස එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාවන් පස සහ සෑම සියලු දේ සමඟ (ප්‍රමාණයෙන් අක්. 12 රූඩ් 00, පර්. 29 ක ඉඩම) මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය පරිදි මා විසින් 2007 ජූලි මස 24 වැනි අඟහරුවාදා පෙ. ව. 11.30ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2004.09.24 *වන දින හා* ඩේලිනිව්ස්, දිනමිණ පුවත්පත් වල 2004.09.08 දින ද පළ කරන ලද යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනයට සහ *රජයේ ගැසට් පත්‍රයේ* 2007.07.06 දින පළ කරන ලද විකුණුම් නිවේදනයට ද අවධානය යොමු කරන්න.

සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් ගෙවිය යුතුය.

*ගෙවීමේ ක්‍රමය–*

1. මිල තීන්දු වූ වහාම ගැනුම් මිලෙන් 10% ක් (සියයට දහයක්)
2. පළාත් අධිකාරියේ අළෙවි බදු වශයෙන් 1% ක් (සියයට එකක්)
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් (සියයට දෙකහමාර)
4. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 500 ක්
5. විකුණුමේ පිරිවැය හා අයකිරීම් වෙතොත් ඒවා
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තුව

ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූව ) ක් වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත, කොළඹ 01, ආදිපාද වීදියේ අංක 11 හි මහජන බැංකු කලාපීය කාර්යාලයේ (බස්නාහිර පළාත 01) සහකාර සාමාන්‍යාධිකාරී වෙත ගෙවිය යුතුය. දුරකථන 2387068/2393678 හා 2344985 ඉහත සඳහන් කළ පරිදි එකී මුදල් දින 30ක් ඇතුළත ගෙවනු නොලැබුවහොත් දැනටමත් ගෙවා ඇති 10% මුදල් අහිමි කොට දේපළ නැවත විකිණීමේ අයිතිය බැංකුව සතුය.

ඩන්ස්ටන් කෙලාට්,
උසාවි කොමසාරිස් සහ බ්‍රෝකර්, රජයේ
සහතික ලත් විශේෂඥ වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ දේපල නියෝජිත.

42, දුටුගැමුණු වීදිය,
පාමංකඩ, දෙහිවල.
දුරකතනය : 2814743
ෆැක්ස් : 2814742 – 2814744.
ක්ෂණික ඇමතුම්: 07722-50422

07 –133

---

## සීමාසහිත සෙලාන් බැංකුව – පරණ යොන් වීදිය ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විකිණීමයි

මීරාණියා වීදිය – කොළඹ 12, අගනා වාණිජමය දේපළ

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ, නාගරික කොට්ඨාශ අංක 16, අළුත්කඩේ නැගෙනහිර කොට්ඨාශයේ, අළුත්කඩේ, මීරාණියා වීදියේ පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ටී. සමීර් විසින් සාදන ලද 1964.02.07 දාතම හා අංක 810 දරන පිඹුරේ ලොට් **J** හි කොටසක් වන, බලයලත් මිනින්දෝරු ජේ.පී. අයි.අබේකෝන් විසින් සාදන ලද 1996 නොවැම්බර් 14 දාතම හා අංක 5511 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට නිරූපිත මීරාණියා වීදියේ (කලින් තොටුපොළ වීදිය) වරිපනම් අංක 209 දරන බෙදා වෙන් කොට සීමා නිර්නය කළ සම්පූර්ණ බිම් කොටස (ප්‍රමාණයෙන් පර්චස් .75 ක ඉඩම) සීමාසහිත සෙලාන් බැංකුව විසින් මා වෙත පවරන ලද බලය පරිදි ඉහත කී දේපල ම විසින් පිහිටි ස්ථානයේ දී 2007 ජූලි මස 23 වැනි දා (සඳුදා) පෙ.ව. 10.30 ට ආරම්භ කොට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. ( ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඊ. එස්.පීරිස් විසින් ලියා සහතික කළ 1998.10.15 දාතම හා අංක 1225 දරන බැඳුම්කරය මත ගෙවිය යුතු මුදල් ගෙවීම බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති කොළඹ මොහමඩ් ඉස්මයිල් මොහමඩ් සාරුක්ට අයත් දේපල)

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 1999.12.03 වන දින *රජයේ ගැසට් පත්‍රය හා* 1999.11.12 වන දින ඩේලිනිවුස්, දිනමිණ, හා තිනකරන් යන පුවත්පත් ද විකුණුම් නිවේදනය සඳහා 2007.07.06 වන දින රජයේ *ගැසට් පත්‍රය* ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය* - විකිණීම ස්ථිර කළ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුවේ :

(1) ගැනුම් මිලෙන් 10% මිල තීන්දු වූ වහාම ගෙවිය යුතුය,
(2) ගැණුම් මිලෙන් ඉතිරි 90% වෙන්දේසි දින සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගෙවිය යුතුය,
(3) පළාත් අධිකාරියට ගෙවිය යුතු දේශීය විකුණුම බද්ද 1% (සියයට එකයි),
(4) විකුණුම් මිළෙන් 2 1/2% (සියයට දෙකහමාරක්) වන වෙන්දේසිකරුගේ කොමිස් මුදල,
(5) රු. 44,943/75 නොඉක්මවන සම්පූර්ණ ප්‍රචාරක වියදමින් 50%,
(6) ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
(7) විකිණීමේ කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2,500.

හිමිකම් ඔප්පු හා වෙනත් අදාළ ලිපිලේඛන කොළඹ 03, ගාලු පාරේ අංක 90 සෙලින්කෝ සෙලාන් ටවර්හි 12 වන මහලේ සීමාසහිත සෙලාන් බැංකුවෙහි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නීති දෙපාර්තමේන්තුව) වෙතින් ලබාගැනීම හා පිරික්සීම කළ හැකි ය.

දුරකථන අංක 4–701000– 2456789

ඩන්ස්ටන් කෙලාට්,
උසාවි කොමාසාරිස් හා බ්‍රෝකර්,
රජයේ සහතිකලත් විශේෂඥ වෙන්දේසිකරු
තක්සේරුකරු හා දේපළ නියෝජිත.

42, දුටුගැමුණු වීදිය,
පාමංකඩ,
දෙහිවල.
දුරකථන : 2814743
දුරකථන/ෆැක්ස් : 2814742, 2814744
ක්ෂණික ඇමතුම් : 0772250422

07-132

---

## මහජන බැංකුව - බේරුවල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ 1999.04.19 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී මා වෙත පවරන ලද බලය පරිදි වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුණ දකුණ, බේරුවල බැද්දෙ කරඳගොඩ පිහිටි, බලයලත් මිනින්දෝරු යූ. එම්. ද සිලවා විසින් සාදන ලද 1976 ජනවාරි 02 දාතම හා අංක 1986 දරන පිඹුරේ ලොට් 2 වශයෙන් ලකුණුකොට ඇති, "කොටගෙවත්ත" නමැති බෙදාවෙන් කොට සීමා නිර්නය කළ බිම් කොටස එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ වගාවන් සහ අනෙකුත් සියලුම දේ සමඟ (ප්‍රමාණයෙන් අක් .00, රූඩ් 01, පර්. 37.91 ක ඉඩම ) මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය පරිදි ඉහත කී දේපළ මා විසින් 2007 ජූලි මස 28 වැනිදා සෙනසුරාදා පෙ. ව. 10.30 ට ආරම්භව බේරුවල, මහජන බැංකු ශාඛා පරිශ්‍රයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළ වෙත ළඟාවන අන්දම .– කොළඹ – ගාල්ල මහා මාර්ගයේ බේරුවල දක්වා ගොස්, බේරුවල කතෝලික පල්ලිය සහ පොලී ස්ථානය අතරින් වම්පසට විහිදෙන ශාන්ත ආනා පාරට ඇතුළුවී, කරඳගොඩ හන්දිය දක්වා කි. මී. 1ක් පමණ ගමන්කොට දෙපසින් වැටී ඇති ගම්සභා පාර දෙක අතර යාබදව පිහිටි දේපළ වෙත ළඟාවන්න.

2000.02.11 *වන දින රජයේ ගැසට් පත්‍රයේ* සහ 2000.05.25 දින ඩේලිනිව්ස්, දිනමිණ, සහ තිනකරන් පුවත්පත් වල පළ කරන ලද යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය ද, 2007.07.06 දින රජයේ *ගැසට් පත්‍රයේ* පළ කළ විකුණුම් නිවේදනය ද බලන්න.

*ගාස්තු ගෙවන පිළිවෙල.*– සාර්ථක ගැණුම්කරු මිළ තීන්දු වූ වහාම පහත දැක්වෙන ගාස්තු මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු පළාත් අධිකාරි බද්ද 1% ක් (සියයට එකක්),
3. විකුණුම් මිලෙන් (සියයට දෙකහමාරක්)2 1/2%ක වෙන්දේසිකරුගේ කොමිස් මුදල,
4. ලිපිකරු හා නිවේදක ගාස්තුව රු. 500 ක්,
5. විකුණුම් පිරිවැය හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා,
6. අලෙවි සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි (සියයට අනූව )90% ක් වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත, පානදුර, ගාලු පාරේ, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කළුතර) මහජන බැංකුව, ප්‍රාදේශීය කළමනාකරු වෙත ගෙවිය යුතුය. දුරකථනය 038-2232438 - 038 2235401.

එකී මුදල ඉහත දැක්වූ පරිදි දින 30ක් ඇතුළත ගෙවනු නොලැබුවහොත් ඒ වන විටත් ගෙවා ඇති ගැණුම් මිළෙන් 10% (සියයට දහයක) මුදල රාජසන්තක කොට දේපල නැවත විකිණීමේ අයිතිය බැංකුව සතුය.

ඩන්ස්ටන් කෙලාට්,
උසාවි කොමසාරිස් සහ බ්‍රෝකර් රජයේ
සහතික ලත් විශේෂඥ වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ දේපල නියෝජිත.

42, දුටුගැමුණු වීදිය,
පාමංකඩ, දෙහිවල.
දුරකතනය : 2814743
ෆැක්ස් : 2814742 – 2814744.
ක්ෂණික ඇමතුම් : 07722-50422

07 –134

---

## සීමාසහිත සෙලාන් බැංකුව - කෙහෙල්වත්ත ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

බස්නාහිර පලාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ අධිකාරි පත්තුවේ කැලණිය උප නගර සභා සීමාව තුළ ගෝනවල ගමේ පිහිටියාවූ ද ගෝනගහවත්ත යයි කියනු ලබන හා හඳුන්වනු ලබන දැන් ලෙස්වලේන් යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. පී. ද සිල්වා විසින් සාදන ලද අංක 161 හා 1985.11.20 දින දරන පිඹුරේ ලොට් අංක 22 ලෙස ලකුණු කොට නිරූපණය කර ඇත්තා වූද පර්චස් පහළොවයි දශම හතරක් (අ.0, රූ.0, පර්. 15.4) විශාල වූ ද කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 466/69 යටතේ ලියාපදිංචි කර ඇත්තා වූ ද බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි, වැව්ලි හා එහි දේපලට ස්ථිර ලෙස සවිකර ඇති උපකරණ හා යන්ත්‍රෝපකරණ හා එහි පිහිටි සියලු දේත්.

තවද එකී අංක 161 දරන පිඹුරේ ලොට් අංක 46, 44, 45 හා 48 දරන (පාර සඳහා වෙන් කිරීම වන) ඉඩම් කොටස් උඩින් හා දිගේ මාර්ග ප්‍රවේශ අයිතිය ද මීට ඇතුලත් වේ.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ 2007 ජූලි මස 21 වන දින පෙරවරු 11.30 ට ඉහත සඳහන් දේපළ එම පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. රජයේ *ගැසට් පත්‍රයේ* 2007.03.30 වන දින දිණමිණ, ඩේලිනිවුස් සහ තිනකරන් යන පුවත්පත්වල 2007.03.19 වන දින ද යෝජනා සම්මුති දැන්වීම පළවී ඇත.

*දේපලට පිවිසීම.*– කැළණි විහාරය පසු කර බියගම පාරේ පැමිණෙන විට නාගහමුල්ල හන්දිය හමුවේ. එතැනින් වමට ඇති පාරේ දිවෙන ගෝනවල පාරේ කි. මී. 1 1/2 පමණ ගමන් කරන විට කරගහමුල්ල හන්දිය හමුවේ. එතැනින් වමට දිවෙන කීල්ස් නිවාස දෙසට දිවෙන පාරේ (මයිනර් රෝඩ්) මීටර් 500 ක් පමණ දුරින් දකුණු පස ගෝනවල උප තැපැල් කාර්යාලය අසල අංක 22 දරන ස්ථානයේ මෙම දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවිය යුතුය.

(1) ගැණුම් මිලෙන් 10% ක්, (2) පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ක් (3) වෙන්දේසියේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2 % ක් (4) ලිපිකරු හා නිවේදන ගාස්තු වශයෙන් රුපියල් 500 ක් (5) විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල (6) විකුණුම් සහතික සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිළෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුව, සහකාර සාමාන්‍යාධිකාරී (බටහිර - 1), නො. 11, ආදිපාද වීදිය, කොළඹ 01. දුරකථන අංක : 2387068, 2393678, 2327848 හිමිකම් හා වෙනත් අදාල විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද පරිදි මුදල් දින 30 ක් ඇතුලත නොගෙවුවහොත් දැනට ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

තුසිත කරුණාරත්න *(සාම විනිසුරු),*
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත,
කොලොන්නාව.
දුරකථනය : 2696155, 2572940

07-108

---

## සීමාසහිත සෙලාන් බැංකුව - පානදුර ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ අධිකාරි පත්තුවේ බියගම ප්‍රාදේශීය සභා සීමාව තුල බොල්ලෑගල පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ඩබ්ලිව්. ඩී. එස්. ද සිල්වා විසින් සාදන ලද 1993.04.04 දිනැති අංක 2128 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කෝන්ගහවත්ත *හෙවත්* කුරුඳුගහවත්ත නැමති ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ කැබලි අංක 1 ලකුණු කළ කේ. ඊ. පෙරේරා මාවත, වරිපනම් අංක 141/7 දරන බෙදා වෙන් කරන ලද සම්පූර්ණ ඉඩම් කොටස අංක 2128 දරන සැලැස්ම අනුව රූඩ් දෙකයි පර්චස් තිස් එකයි දශම දෙකක් (අ.0, රූ.2, පර්. 31.2) ක් විශාල ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 532/27 යටතේ ලියාපදිංචි කර ඇත.

මෙම දේපල පානදුර පදිංචි බොල්ලෑගලගේ චිත්‍රා යන අය බන්ධනදායී වශයෙන් සීමාසහිත සෙලාන් බැංකුව වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

ඉහත සඳහන් දේපළ 2007 ජූලි මස 24 වැනි දින පෙරවරු 10.30ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම.*– කොළඹ සිට නුවර පාරේ යන විට පැලියගොඩ ඇති 4 වන සැතපුම් කණුවෙන් දකුණට ඇති බියගම පාරට හැරී කි. මී. 7-8 ක් ඉදිරියට ගිය විට හමුවන බොල්ලෑගල හන්දියෙන් වමට ඇති විජේරාම පාරට හැරෙන්න. එම පාරේ මීටර් 400 ක් ඉදිරියට ගිය විට හමුවන විජේරාම පන්සල අසලින් වමට ඇති කේ. ඊ. පෙරේරා මාවතට හැරෙන්න. (මෙම පාර පන්සල තාප්පය අසලින් පිහිටා ඇත.) එම පාරේ මීටර් 100 ක් ගිය විට හමුවන දකුණට ඇති වංගුවේ වම් පස පිහිටා ඇති නො. 221/4, අසලින් පිහිටා ඇති අඩි 15 ක් පළල බොරලු පාරේ මීටර් 100 ක් ගිය විට එම පාර අවසානයේ මෙම ඉඩම පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම රජයේ *ගැසට් පත්‍රයේ* 2007.04.20 දින පළවී ඇති අතර ඩේලිමිරර් පත්‍රයේ සහ ලංකාදීප පත්‍රයේ 2007.03.07 වන දින පළවී ඇත. සහ වීරකේසරී පත්‍රයේ 13.03.2007 වන දින පළවී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

(1) ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), (2) පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% ක් වන පළාත් අධිකාරි බද්ද (සියයට එකක්), (3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2 .5% (සියයට දෙකහමාරක්), (4) නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, (5) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, (6) සියලුම ප්‍රචාරක වියදම් ද, ගැණුම් මිළෙන් ඉතිරි 90% ද, විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සීමාසහිත සෙලාන් බැංකුවට ගෙවා නිමකළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න: ජ්‍යෝෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නීති), සීමාසහිත සෙලාන් බැංකුව, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-2456285, 2456263, 2456284.

තුසිත කරුණාරත්න *(සාම විනිසුරු)*
බලයලත් වෙන්දේසිකරු සහ,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත,
කොලොන්නාව.
දුරකථනය : 011 - 2696155, 2572940

07-109

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0100005193.

ණයකරුගේ සම්පූර්ණ නම : මහතෙල්ගේ ටියුසන් සමන්ත පීරිස් සහ ලිඳමුලගේ රංජිනි සිල්වා

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය

සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2004.08.20 වැනි දින අංක 1355 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2004.08.21 වන දින "දිනමිණ", "ද අයිලන්ඩ්","තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ, 228/ඒ, වලව්වත්ත, කැස්බෑව යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ඒ. එස්. ලියනගේ මයා විසින් 2007.07.26 වන දින පෙ. ව. 11.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ පනස් නම දහස් හත්සිය හතලිස් හයයි ශත හැට හයක් (රු.159,746.66) මුදලක් වර්ෂ 2003.07.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ විසි දෙදහස් දෙසිය හැත්තෑ පහයි ශත එකොළහක (රු. 122,275.11) මුදල ද, 2003.07.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් තිස්හත්දහස් හාරසිය හැත්තෑ එකයි ශත පනස් පහක් (රු. 37,471.55) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ පනස් නම දහස් හත්සිය හතලිස් හයයි ශත හැට හයක් (රු. 159,746.66) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ විසි දෙදහස් දෙසිය හැත්තෑ පහයි ශත එකොළහක (රු. 122,275.11) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.00% බැගින් වන පොළියක් 2003.08.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ සල්පිටි කෝරළේ මොරටුව නගර සභා සීමාවේ එගොඩ උයන ග්‍රාමයේ මහවත්ත පාරේ වරිපනම් අංක 250/11 හි පිහිටි මාදන්ගහවත්ත නැමැති ඉඩමට 1993/10/30 දින බී. එල්. ඩී. ප්‍රනාන්දු මානක තැන විසින් මැන සම්පාදිත අංක 4162 පිඹුර ප්‍රකාර ඉඩමට මායිම්, උතුරට: අඩි 20 ක් පළල පාර ද, නැගෙනහිරට: බී. සී. එස්. සිරිරත්නට අයත්ව තිබූ මෙම ඉඩමේම කොටසක් ද, දකුණට : සහ බටහිරට: බී. ඩී. එස්. සිරිරත්නට අයත් එම ඉඩමේම ඉතිරි කොටස ද යන මායිම් තුළ පර්චස් හයක් (අ.0, රූ.0, පර්.06) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද මාර්ග පරවශතාවය ද සමග කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1979/119 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

වර්ෂ 2007ක් වූ ජුනි මස 22 වැනි දින කොළඹ දී ය.

සාමාන්‍යාධිකාරී.

07-115

---

### රුහුණ සංවර්ධන බැංකුව – කැකණදුර ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

රුහුණ සංවර්ධන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මෙහි පහත විස්තර වන දේපල 2007.08.02 දින පෙ.ව. 10.30ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත්සතර තුළ නාවිමන (දකුණේ) පිහිටි ගෙදරවත්ත හෙවත්, පැළකැටිය වත්ත නොහොත් ගබඩාගේවත්ත නැමති ඉඩමේ බෙදා වෙන් කරන ලද "ඒ" අක්ෂරය දරන රූඩ් එකයි පර්චස් හතක් (අක්කර 0, රූඩ් 01 පර්චස් 07) ක් විශාල ඉඩමේ සියළු ගහකොළ, පළතුරු ගොඩනැගිලි ආදී සියළු දේ ද වේ.

වැඩි විස්තර සඳහා 2002.01.04 දින *රජයේ ගැසට් පත්‍රයද*, 2003.02.14 දින දිනමිණ, තිනකරන් හා දී අයිලන්ඩ් යන පුවත්පත්වලද පළ කර ඇති වෙන්දේසි යෝජනාවට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.–* මාතර, දික්වැල්ල පාරේ කි. මී. 1 1/2ක් ගිය විට වෙළේවත්ත මංසන්ධිය හමුවේ. එතැනින් වමට හැරී වෙළේවත්ත පාරේ. කි. මි. 01ක් ගිය විට දීයගහ - අපරැක්ක පාර හමුවේ. එම පාරේ කි. මී. 02ක් පමණ ගිය විට නාවිමන දකුණ සමූපකාරය හමුවේ. එතැනින් වමට වැටී ඇති හුංගම් ගොඩ පාරේ කි. මී, 02ක් ගිය විට පාරේ දකුණු පසින් මෙම දේපල හමුවේ.

*ගෙවීමේ ක්‍රමය* - වෙන්දේසිය තීන්දු කළ විගස පහත සඳහන් මුදල් ගැණුම්කරු විසින් මුදලින් ගෙවිය යුතුය.

01. ගැණුම් මිළෙන් 25%ක් ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා විකුණුම් මිලෙන් 1%ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් 2 1/2%ක් ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,
05. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු ඇතොත් එම මුදලද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 75%ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත මාතර, පඹුරන, අනගාරික ධර්මපාල මාවතේ අංක 382ඒ, දරන ස්ථානයේ පිහිටි රුහුණ සංවර්ධන බැංකුවේ, ප්‍රධාන කාර්යාලයේ සාමාන්‍යාධිකාරී මහතාට ගෙවිය යුතුය.

ඉහත සඳහන් පරිදි දින 30ක් ඇතුළත අදාළ මුදල නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 25%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථන අංක : 041-2231532, 2226208, 2226209

පී. පී. ආනන්ද,
සාමවිනිසුරු, බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත, වල්ගම, මාතර.
දුරකථන අංකය : 041-2228731
07-24

---

### සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - වැලිමඩ ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් එච්. රාජපක්ෂ විසින් සහතික කරන ලද්දාවූ ද සී/සහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූ ද 2005.01.04 වන දින සහ අංක 70 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම රත්නායක මුදියන්සේලාගේ පුංචි බණ්ඩා රත්නායක ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්,

සී/ස හැටන් නැෂනල් බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියළු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල 2007 ජූලි මස 23 වන දින පෙ.ව. 11.00ට ඇරඹෙන පරිදි දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, උඩුකින්ද කොට්ඨාශයේ, දඹවිනි පළාත කෝරළේ, රත් කරව්ව ගමේ පිහිටි "ගොන් එළවන මංකඩ" නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක පී. ඩබ්. නන්දසේන විසින් 1994 ක්වූ නොවැම්බර් මස 13 වන දින මැන සාදන ලද අංක 660 දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කරන ලද ලොට් 1 දරන ඉඩම.

*විශාලත්වය* : රූඩ් 01 යි පර්චස් 29

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2007.03.09 දින දරන *රජයේ ගැසට් පත්‍රය* හා 2007.03.21 වන දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය* - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දහම පහ (2.5%) ක් ද,
4. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියය (රු. 500) ක් ද,
5. සියළුම ප්‍රචාරක වියදම්,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහ (රු. 2,000)ක් ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුලත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10%ක මුදල අහිමි කිරිමට සහ දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ප්‍රධාන කළමනාකරු (ණය අයකිරීම්), සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10 දුරකථන අංක : 2661815, 2661816 ගෙන් ලබාගත හැක.

එන්. එච්. පී. එෆ්. ආරියරත්න,
උසාවි කොමසාරිස් හා බලයලත් වෙන්දේසිකරු.

අංක 34/31, සහ 32
නීතිඥ කාර්යාල සංකීර්ණය,
කොළඹ 12.
07-112

---

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2007 අංක 244

DRF/RECT/580(IV)AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද මරණින් පසු නිල උසස් කිරීමක්

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ මරණින් පසු නිල උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර තිබේ.

(අ) මේජර් තුවාන් නිසාම් මුතාලිෆ් සබුබ
(1) 2005 මැයි මස 01 වන දින සිට මරණයෙන් පසු ලුතිනන් කර්නල් නිලයට උසස් කිරීම
(2) 2005 මැයි මස 31 වන දින සිට මරණයෙන් පසු කර්නල් නිලයට උසස් කිරීම

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අප්‍රේල් මස 19 වන දින.
07-34/1

---

2007 අංක 245

DRF/RECT/580(IV)AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් හා මරණින් පසු උසස් කිරීමක්

පහත නම සඳහන් නිලධාරිගේ නිලය ස්ථිර කිරීම/මරණයෙන් පසු උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර තිබේ.

(අ) කපිතන් (තාවකාලික මේජර්) බෙන්තොට හේවගේ පර්සි ජගත් ගැහේබ
(1) 2006 අප්‍රේල් මස 22 දින සිට මේජර් නිලය ස්ථිර කිරීම
(2) 2006 අප්‍රේල් මස 22 දින සිට මරණයෙන් පසු ලුතිනන් කර්නල් නිලයට උසස් කිරීම

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මැයි මස 09 දින,
කොළඹ දී ය.
07-34/3

---

2007 අංක 246

DRF/RECT/580/(IV)AY

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද මරණින් පසු නිල උසස් කිරීමක්

1. පහත නම සඳහන් නිලධාරිගේ මරණයෙන් පසු නිල උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර තිබේ :

(අ) නි/65120 කපිතන් කරුණාතිලක මුදියන්සේලාගේ චමින්ද බණ්ඩාර කරුණාතිලක කරෙ
(1) 2006 ජූලි මස 31 දින සිට මරණයෙන් පසු මේජර් නිලයට උසස් කිරීම

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අගෝස්තු මස 24 වැනි දින,
කොළඹ දී ය.
07-34/2

---

2007 අංක 247

DRF/21/RECT/2365.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2006 අප්‍රේල් මස 06 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/60901 කපිතන් (තාවකාලික මේජර්) ගමරාලලාගේ සුනිල් ආරියසේන ආර්එස්පි ගරෙ.

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරියා 2006 අප්‍රේල් මස 07 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/60901 මේජර් ගමරාලලාගේ සුනිල් ආරියසේන ආර්එස්පී ගරෙ.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පි පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අගෝස්තු මස 02 වැනි දින,
කොළඹ දී ය.
07-40

---

2007 අංක 248

DRF/21/RECT/2369.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරියා 2006 ජුනි මස 30 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/60671 කපිතන් (තාවකාලික මේජර්) ජානක එදිරිසිංහ ආර්එස්පී ශ්‍රීලපාහ

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරියා 2006 ජූලි මස 01 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/60671 මේජර් ජානක එදිරිසිංහ ආර්එස්පී ශ්‍රීලපාහ.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ජූලි මස 31 වැනි දින,
කොළඹ දී ය.
07-41

---

2007 අංක 249

DRF/21/RECT/2368

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2006 ජුනි මස 30 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/61052 කපිතන් (තාවකාලික මේජර්) කපිල ශ්‍රී රවින්ද්‍ර කන්දෙ විදානරාළගේ ආර්එස්පි ශ්‍රීලයුපොදුසේබ

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරියා 2006 ජූලි මස 01 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/61052 මේජර් කපිල ශ්‍රී රවින්ද්‍ර කන්දෙ විදානරාළගේ ආර්එස්පී ශ්‍රීලයුපොදුසේබ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පි පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අගෝස්තු මස 02 වැනි දින,
කොළඹ දී ය.
07-42

---

2007 අංක 250

DRF/21/RECT/2367.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරියා 2006 අගෝස්තු මස 04 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/60965 මේජර් වෙල්ලප්පිලි විජේරත්නලාගේ රියන්සි දයානාත් විජේරත්න ආර්එස්පී ශ්‍රීලපාහ.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අගෝස්තු මස 02 වැනි දින,
කොළඹ දී ය.
07-36

2007 අංක 251

DRF/21/RECT/2350.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 2006 ජූලි මස 03 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/62814 කපිතන් ලක්මාල් ප්‍රියශාන්ත බලගල්ල ආර්ඩබ්පී ආර්එස්පී ශ්‍රීලකාහ.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ජූනි මස 02 වැනි දින,
කොළඹ දී ය.
07-39

---

2007 අංක 252

DRF/21/RECT/2370

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරියා 2006 ජූලි මස 04 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/62650 කපිතන් (උපකරණ පාලක) ජයසිංහ ආරච්චිගේ පද්මසිරි ශ්‍රීලවියාඉ

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම**

පහත නම සඳහන් නිලධාරියා 2006 ජූලි මස 04 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/62650 කපිතන් (උපකරණ පාලක) ජයසිංහ ආරච්චිගේ පද්මසිරි ශ්‍රීලවියාඉ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි
ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අගෝස්තු මස 02 වැනි දින,
කොළඹ දී ය.
07-31

---

2007 අංක 253

DRF/21/RECT//2373.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරියා 2006 ජූලි මස 10 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කපිතන් හර්ෂ සඳමාල් වීරසූරිය, ශ්‍රීලයුපොහේබ (නි/62922)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අගෝස්තු මස 07 වැනි දින,
කොළඹ දී ය.
07-38

---

2007 අංක 254

DRF/21/RECT/2366.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය(පොදු) උපසේවයට මාරු කිරීමක්

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරියා 2006 ජූලි මස 23 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/62400 කපිතන් (උපකරණ පාලක) පේලි කංකානමලාගේ සිරිපාල, ශ්‍රීලපාහ

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය(පොදු) උපසේවයට මාරු කිරීම**

පහත නම සඳහන් නිලධාරියා 2006 ජූලි මස 23 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් වි සින් අනුමත කර ඇත :

නි/62400 කපිතන් (උපකරණ පාලක) පේලි කංකානමලාගේ සිරිපාල, ශ්‍රීලපාහ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අගෝස්තු මස 02 වැනි දින,
කොළඹ දී ය.
07-32

---

2007 අංක 255

DRF/21/RECT/2372.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරියා 2006 අගෝස්තු මස 03 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/61190 කපිතන් (උපකරණ පාලක) අබේසේකර හෙට්ටිගේ හෙන්රි, ගැහේබ

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය(පොදු) උපසේවයට මාරු කිරීම**

පහත නම සඳහන් නිලධාරියා 2006 අගෝස්තු මස 03 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය(පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/61190 කපිතන් (උපකරණ පාලක) අබේසේකර හෙට්ටිගේ හෙන්රි, ගැහේබ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අගෝස්තු මස 02 වැනි දින,
කොළඹ දී ය.
07-33

---

2007 අංක 256

DRF/21/RECT/2364.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අනිවාර්යය විශ්‍රාම ගැන්වීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරියා 2006 ජූනි මස 01 වන දින සිට අනිවාර්යය විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/64443 ලුතිනන් බොලපේ හේරත් මුදියන්සේලාගේ බුද්ධික චමින්ද ධර්මකීර්ති, ඉසේබ.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අගෝස්තු මස 02 වැනි දින,
කොළඹ දී ය.
07-37

---

DRF/21/RECT/2376.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අපකීර්ති සහගත ලෙස යුද හමුදා සේවයෙන් පහ කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරියා 2006 ජූනි මස 30 වන දින සිට අපකීර්ති සහගත ලෙස යුද හමුදා සේවයෙන් පහ කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/63506 ලුතිනන් වටරක ගමගේ අචින්ද්‍ර මාධව නරේන්ද්‍රසිරි, ශ්‍රීලකාහ.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 සැප්තැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.
07-43

---

DRF/21/RECT/2371.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉවත් කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරියා 2006 ජූනි මස 30 වන දින සිට අධිකාරියෙන් ඉවත් කරනු ලැබීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/64664 ලුතිනන් මනික්කු වඩු චාරුක නිරංජන විමලසූරිය, ශ්‍රීලයුසේබ.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අගෝස්තු මස 01 වැනි දින,
කොළඹ දී ය.
07-44

---

2007 අංක 257

DRF/21/RECT/30/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල උසස් කිරීමක් සහ පත් කිරීමක්

**නිල උසස් කිරීම**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2006 අගෝස්තු මස 26 දින සිට මේජර් ජෙනරාල් නිලයට උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/1956 බ්‍රිගේඩියර් වරකාපිටිය අබේකෝන්ගේ දොන් සුනිල් සිල්වා

**පත්කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2006 අගෝස්තු මස 26 දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා සෙවේච්ඡා බලසේනාවේ නියෝජ්‍ය සේනාවිධායක තනතුරට පත් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/1956 මේජර් ජෙනරාල් වරකාපිටිය අබේකොන්ගේ දොන් සුනිල් සිල්වා

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 සැප්තැම්බර් මස 08 වැනි දින,
කොළඹ දී ය.
07-45/2

---

2007 අංක 258

DRF/21/RECT/30/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2006 මැයි 26 වැනි දින සිට තාවකාලික බ්‍රිගේඩියර් නිලයට උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරනු ලැබ ඇත :

කර්නල් විදානෙලාගේ හානි සොයිසා (නි/2069)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 සැප්තැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.
07-45/1

---

2007 අංක 259

DVF/RECT/261.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්

පහත නම සඳහන් නිලධාරි 2006 මාර්තු මස 21 දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/4675 ලුතිනන් වික්ටර් විනෝද් හේවා, ගැහේබ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි.
ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ජූලි මස 31 දින,
කොළඹ දී ය.
07-35

---

# ආණ්ඩුවේ නිවේදන

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 34 (2) (අ) වගන්තිය යටතේ නියමය**

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 34 (2) (අ) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, රංජිත් සියඹලාපිටිය වන මම මෙහි පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් ආයතනය එකී වගන්තියෙහි කාර්ය සඳහා අනුමත පුණ්‍යායතනයක් ලෙස මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

රංජිත් සියඹලාපිටිය,
වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය.

2007 ජූනි මස 14 වැනි දින,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

උපලේඛනය

"කොමර්ෂල් බැංකු සමාජ වගකීම් භාරයේ උසස් අධ්‍යාපනය සඳහා වූ ශිෂ්‍යත්ව අරමුදල"

07-70

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 34 (2) (අ) වගන්තිය යටතේ නියමය**

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 34 (2) (අ) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වැඩබලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, රංජිත් සියඹලාපිටිය වන මම මෙහි පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් ආයතනය එකී වගන්තියෙහි කාර්ය සඳහා අනුමත පුණ්‍යායතනයක් ලෙස මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

රංජිත් සියඹලාපිටිය,
වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය.

2007 ජූනි මස 15 වැනි දින,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

උපලේඛනය

" ආර්ක් එන් සියල් (දේදුනු) ආයතනයේ දිළිඳු දරුවන් සුරැකුම් අරමුදල"

07-71

---

**විවාහ සිදුකිරීම සඳහා දේවස්ථානය ලියාපදිංචි කිරීම**

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තියේ විධිවිධාන අනුව එල්. කේ. රත්නසිරි නමැති, ශ්‍රී ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එල්. කේ. රත්නසිරි,
රෙජිස්ට්‍රාර් ජෙනරාල්.

2007 ජූනි මස 06 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජෙනරාල් කාර්යාලය, කොළඹ 11.

| අංකය | ලියාපදිංචි කිරීමේ දිනය | විස්තරය | පිහිටීම | දේවගැතිතැන, අයිතිකරු හෝ භාරකරු | ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද |
|---|---|---|---|---|---|
| 1401 | 2007.05.15 | බැප්ටිස්ට් දේවස්ථානය | කැකිරාව | ජේ. ආර්. කොස්තා දේවගැතිතුමා | ක්‍රිස්තියානි (බැප්ටිස්ට් සභාව) |

07-84

එල්.ඩී.බී. 277/40

### පුරාවස්තු ආඥාපනත

(188 වන අධිකාරය වන) පුරාවස්තු ආඥාපනතේ 18 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යවරයා විසින් පනවනු ලබන ආඥාවයි.

අනුර බණ්ඩාරනායක,
ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍ය.

2007 මැයි මස 08 වැනි දින,
කොළඹ දී ය.

### ආඥාව

මෙහි වූ උපලේඛනයේ නිශ්චිතව සඳහන් පුරාණ ස්මාරක (188 වන අධිකාරිය වන) පුරාවස්තු ආඥාපනතේ කාර්යයන් සඳහා ආර්ක්ෂිත ස්මාරක වශයෙන් මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

### උපලේඛනය

### ආරක්ෂිත ස්මාරක ලෙස ප්‍රකාශයට පත්කරනු ලබන ස්මාරක වල ලැයිස්තුව

1. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හෙට්ටිපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දේමැදගම ග්‍රාම නිලධාරි වසමේ, කළුබොඩ ග්‍රාමයේ පිහිටි නිකසලා ආරණ්‍ය සේනාසන භූමියට අයත් ලෙන් ලිපිය සහිත කටාරම් කොටු ලෙන සහ පැරණි පොකුණු දෙක,
2. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හෙට්ටිපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හිරිපොකුණ ග්‍රාම නිලධාරි වසමේ, නිකපිටිය ග්‍රාමයේ පිහිටි පන්සල්හේනවත්ත ඉඩමට අයත් පැරණි දාගැබ් ගොඩැල්ල, පෝය ගෙය සහ ගල්කුළුණු සහිත භූමිය,
3. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හෙට්ටිපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මුණිහිරිගම ග්‍රාම නිලධාරි වසමේ, ගල්කන්ද ග්‍රාමයේ පිහිටි වෙහෙරගල විහාරස්ථාන භූමියට අයත් දාගැබ් ගොඩැල්ල, පැරණි ගොඩනැගිලි දෙක සහ පොකුණ,
4. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හෙට්ටිපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දේමැදගම ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කන්දේ මැදගම මහා චෛතියගිරි විහාර භූමියට අයත් දාගැබ, බෝධිඝරය, සංකර්ෂිත ගොඩනැගිලි දෙක, කටාරම් සහිත ලෙන් විහාරය, ලෙන් ලිපිය සහිත ලෙන සහ අවට විසිරී ඇති පුරාවිද්‍යාත්මක අවශේෂ,
5. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හෙට්ටිපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දේමැදගම ග්‍රාම නිලධාරි වසමේ, මැදගම කන්දේ පිහිටි විජය සොහොන,
6. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හෙට්ටිපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බමුණුමුල්ල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි බමුණුමුල්ල බතලගොඩ වැව ඉස්මත්තේ ඇති දාගැබ් ගොඩැල්ල සහ ටැම්පිට විහාරයට අයත් අවශේෂ,
7. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වාරියපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මළගනේ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි වළගම්බා පුරාණ විහාර භූමියට අයත් කටාරම් සහිත ලොන් විහාරය සහ පැරණි ප්‍රාකාරය,
8. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වාරියපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නැටිය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි, නුවර කන්ද පුරාණ විහාර භූමියට අයත් පැරණි චෛත්‍යය පාදම, ආසනඝරය, පැරණි සෙල්ලිපි, බ්‍රාහ්මී අක්ෂර සහිත ලෙන් සහ ලෙන් විහාරය,
9. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 604 නහල්ල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි නහල්ල පැරණි අම්බලම,
10. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 604 නහල්ල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි පොල්කුඹුර සාගල්ලිපුර පුරාණ විහාර භූමියට අයත් කටාරම් සහිත ලෙන් 05, පර්වත ලිපිය සහ ගල්කණු,
11. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 569 දෙල්විට ග්‍රාම නිලධාරි වසමේ පිහිටි දෙල්විට පුරාණ විහාර භූමියට අයත් පැරණි ප්‍රතිමා ගෘහය,
12. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පානගමුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පානගමුව බාඹරුව පුරාණ විහාර භූමියට අයත් පැරණි ප්‍රතිමා ගෘහය සහ කටාරම් කෙටූ ලෙන් තුන
13. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගනේගොඩ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි වේරගොඩ පුරාණ විහාර භූමියට අයත් චෛත්‍යය ගොඩැල්ල සහ ගල්කණු
14. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පහල ඕගොඩපොල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි විල්ගම්වෙහෙර පුරාණ විහාර භූමියට අයත් චෛත්‍යය ගොඩැල්ල, ගල්කණු, ශිලාලිපිය සහ ගල් පර්වතයේ කොටා ඇති පියගැටපෙල
15. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 586 මහවෙල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි පාදෙනිය ග්‍රාමයේ පිහිටි විල්ගම්වෙහෙර, පුරාණ විහාර භූමියට අයත් ශිලා ලිපිය, පැරණි දාගැබ හා ඒ අවට විසිරී ඇති පුරාවිද්‍යාත්මක අවශේෂ
16. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 624 අක්කර පනහ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි අලවල ග්‍රාමයට අයත් අලවල ශිලා ලිපිය.
17. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 603 රම්බඩගල්ල ග්‍රාමයේ පිහිටි පෙත්මගයාය පුරා විද්‍යා ස්ථානයට අයත් ශිලාලේඛන හතර සහ කටාරම් සහිත ලෙන් 5 ඇතුළු අනෙකුත් පුරාවස්තු
18. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 601 ඕගොඩපොල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කොට්ටංග ගමට අයත් කොට්ටංග ශිලාලිපිය
19. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 539 කොටුහේන ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ශ්‍රී විශුද්ධාරාම පුරාණ විහාර භූමියට අයත් පැරණි ස්තූපය සහ ගොඩනැගිලි නටබුන්
20. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වතුවත්ත ග්‍රාම නිලධාරි වසමේ පිහිටි වතුවත්ත ශ්‍රී සුනන්දාරාම විහාර භූමිය තුළ පිහිටා ඇති ටැම්පිට විහාරය සහ පෝය සීමා තුළ ඇති දාගැබ
21. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හොරවඩුන්න ග්‍රාම නිලධාරි වසමේ පිහිටි හොරවඩුන්න ශ්‍රී සුදර්ශන ශෛලබිම්බාරාම පුරාණ විහාර භූමියට අයත් පැරණි ප්‍රතිමා ගෘහය.
22. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුපොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තිස්සව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කුඹුක්වැව ශ්‍රී නාගරුක්ඛාරාම විහාර භූමියට අයත් ටැම්පිට විහාරය
23. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 489 දොළුව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි දොළුව රංකිරිමඩ රජමහා විහාර භූමියට අයත් කටාරම් සහිත ලෙන, දික්ගෙය පිහිටි ගලෙහි කෙටූ සිරිපතුල, ලෙන් ලිපිය සහිත ලෙන
24. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බණ්ඩාරගල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි බණ්ඩාරවෙල, බෝගහමුල්ලවත්ත කළුගල නමැති ස්ථානයේ ඇති ශිලාලේඛනය, කණු පාදම්ගල් ගොඩනැගිලි අවශේෂ, ගල්කණු සහ පැරණි චෛත්‍යය.
25. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සාලියගම පළාත අංක 343 ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මංගලාරාම ගනේකන්ද රජමහා විහාර භූමියට අයත් මහනුවර යුගයේ සිතුවම් සහිත ප්‍රතිමා ගෘහය, කටාරම් සහ ශිලාලේඛන සහිත සියලුම ලෙන්, පර්වතයේ කොටා ඇති සිරිපතුල්ගල, ගල්කුළුණු සහ දාගැබ.
26. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මාස්පොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔග්ගමුව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කළුගල්ල ග්‍රාමයේ පිහිටි ශ්‍රී නීලගිරි රජමහා විහාර භූමියට අයත් කටාරම් සහිත ලෙන, පර්වත මුදුනේ ඇති චෛත්‍යය නටබුන් සහ භූමියේ විසිරී ඇති වෙනත් පුරාවිද්‍යාත්මක නටබුන්
27. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රස්නායකපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 267 ග්‍රාම නිලධාරි වසමේ හේනේගෙදර ග්‍රාමයේ ලොට් අංක 80 දරන කළුගල සහිත ප්‍රදේශයේ පිහිටි කටාරම් සහිත ලෙන සහ දැගැබ් ගොඩැල්ල
28. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 166 කෝන්වැව වදකහගල පුරාණ විහාර භූමියට අයත් පැරණි ප්‍රතිමා ගෘහය
29. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 206 පොතුවැව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ගුරුගොඩ ග්‍රාමයේ පිහිටි ශ්‍රී ශාක්‍යමුණු විහාර භූමියට අයත් ඉපැරණි ගල්කණු සහිත නටබුන් ප්‍රදේශය.
30. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 138 කට්ටඹුවාව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි දියගැබේ පුරාණ විහාර භූමියට අයත් කටාරම් සහිත ලෙන් විහාරය සහ ලෙන, සෙල්ලිපි 02, ගිරිලිපි 04 සහ වැව
31. වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 524 මහවැව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මහවැව නාගාරාම පුරාණ විහාර භූමියට අයත් ටැම්පිට විහාරය
32. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රජවීදිය ග්‍රාමයේ පිහිටි බ්‍රිතාන්‍ය පාලන සමයට අයත් පරිපාලන නිලධාරීන්ගේ නිල නිවාසය
33. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලේපොල උතුර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි වෙළුවනාරාම පුරාණ විහාර භූමියේ පිහිටා ඇති ප්‍රතිමා ගෘහය සහ අටුව
34. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ,නාගොල්ල ග්‍රාම නිලධාරි වසමට අයත් පැරණි පිංතාලිය
35. මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොට්ටල ග්‍රාම නිලධාරි වසමට අයත් ශුද්ධ වූ එමානුවෙල් දෙව්මැදුර
36. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩවෙල, උඩගම නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි හන්තාන රජමහා විහාර භූමියට අයත් පැරණි ප්‍රතිමා ගෘහය සහ අවාස ගෙය
37. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩුගන්නාව ග්‍රාම නිලධාරි වසමේ කඩුගන්නාව නගරයේ පිහිටා ඇති ඓතිහාසික ඩෝසන් කුළුණ
38. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 432 ග්‍රාම නිලධාරි වසමේ ඇත්විල්වත්ත නමැති ඉඩමේ පිහිටා ඇති සීතා ලෙන නමින් හඳුන්වන කටාරම් කෙටූ ගල්ලෙන
39. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හේන්පිට ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ඇඹුල්ගම රජමහා විහාර භූමියට අයත් උඩමළුවේ පිහිටි කටාරම් සහිත ගල්ලෙන් දෙක සහ පහත මළුවේ පිහිටා ඇති පැරණි ආවාස ගෙය
40. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුරගල ග්‍රාම නිලධාරි වසමේ කුරගල කන්දේ ඇති ප්‍රාග් ඓතිහාසික මානව ජනාවාස සාධක සහිත ස්වාභාවික ලෙන
41. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මැද කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාළිගාවත්ත ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මාළිගාවත්ත මුස්ලිම් සුසාන භූමියේ ඇති හුසෙන් ලෙබ්බේ නැමැත්තාගේ සුසානය, මස්තාන් මවුලානා නැමැත්තාගේ සොහොන් ගෙය සහ අෂ්ඨාකාර සොහෙන් ගෙය
42. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බාන්ස් ප්‍රදේශයේ පිහිටි බාන්ස් හෝල් ඉඩමට අයත් පැරණි නිවස.
43. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 817/ඒ, පහල කුඩලිගම ග්‍රාම නිලධාරි වසමේ පිහිටි බුලත්වතුකන්ද නැමැති කන්දේ ගල්තලාවක් මත පිහිටා ඇති පාදම් කණු වලවල් සහිත ගොඩනැගිලි අවශේෂ ස්ථානය.
44. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හල්වල කදු මුදුනේ පිහිටා ඇකි පවුරේ කන්ද පුරාණ විහාර භූමියට අයත් පැරණි ප්‍රතිමා ගෘහය.
45. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගිරිකුළුව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ශ්‍රී සුබෝධාරාම පුරාණ විහාර භූමියට අයත් ප්‍රතිමා ගෘහය.
46. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දොම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සමනබැද්ද 416ඒ ග්‍රාම නිලධාරි වසමේ සමනබැද්ද ගමේ පිහිටි ගනේඋඩ රජමහා විහාර භූමියට අයත් කටාරම් සහිත ගල්ලෙන්, පොකුණ, පඩිපෙල සහ ශිලාලිපි.
47. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ඔකේවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හීනටිගහමුන ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කොට්ටඹ ශ්‍රී සුභද්‍රාරාම විහාර භූමියට අයත් පැරණි ප්‍රතිමා ගෘහය.
48. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩේ වීදිය නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි අනගාරික ධර්මපාල මාවතෙහි වරිපනම් අංක 26 දරන ස්ථානයේ ඇති පැරණි නිවස (ආරච්චි වලව්ව)
49. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උයන්වත්ත ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මාතර තාරකා කොටුව ආසන්නයේ ඇති පැරණි ප්‍රාකාරය සහ වෙඩිබෙහෙත් ගබඩාව.
50. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 433 සී, ග්‍රාම නිලධාරි වසමේ පිහිටි දෙවිනුවර සිංහාසන මාවතේ වරිපනම් අංක 40 දරන පී. එම්. කනකරත්න ද සිල්වා මහතාට අයත් පැරණි නිවස (රේන්ද ගෙදර)
51. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පලල්ල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි වැලිගම කෝවිලකන්ද පුරාණ විහාර භූමියට අයත් පැරණි ප්‍රතිමා ගෘහය.
52. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 25, මධ්‍යම ඇල්පිටිය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ගනේගොඩ රජමහා විහාර භූමියේ පිහිටා ඇති ප්‍රතිමා ගෘහය, ධර්ම ශාලාව චෛත්‍යය පොකුණ සහ ශිලාකුළුණ.
53. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, හඹරාදුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බොන්ස්විටා 137බී, ග්‍රාම නිලධාරි වසමේ පිහිටි රුමස්සල පැරණි කුළුණ.
54. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වවුලාගල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ගෝනාපීනුවල ශ්‍රී ශෛලකූඨාරාම පුරාණ ගල්ලෙන් විහාර භූමියට අයත් කටාරම් සහිත ලෙන් විහාරය සහ පැරණි චෛත්‍යය.
55. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, හබරාදුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කතළුව නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කතළුව අටදාගේ වලව්ව හා ප්‍රාකාරය.
56. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රත්නපුර නගර බටහිර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි රත්නපුර බණ්ඩාරනායක මාවතේ වරිපනම් අංක 4 දරන ස්ථානයේ ඇති පැරණි ගොඩනැගිල්ල.
57. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රත්නපුර නගර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ප්‍රැන්ක් හෙට්ටිආරච්චි මාවතේ වරිපනම් අංක 1/1 දරන ස්ථානයේ ඇති පැරණි ගොඩනැගිල්ල.
58. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රත්නපුර නගර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි රත්නපුර ඕලන්ද කොටුව තුළ පිහිටා ඇති වරිපනම් අංක 58/1 දරන ස්ථානයේ ඇති පැරණි ගොඩනැගිල්ල.
59. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වෙරළුප ග්‍රාම නිලධාරි වසමේ පිහිටි දේවාලේගාව ගල්කඩුව පුරාණ ගල්ලෙන් විහාරය.
60. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කෝන්ගස්මංකඩ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි වැලිපත පුහුල්යාය පුරාණ ගල්ලෙන් විහාර භූමියට අයත් (විදර්ශන ගල්ලෙන් විහාරය) බ්‍රාහ්මී අක්ෂර සහිත කටාරම් කොටන ලද ගල්ලෙන.
61. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දියවින්න ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ගනේලන්දගම දියවි න්න දේවගිරි පුරාණ ගල්ලෙන් විහාර භූමියට අයත් පැරණි ලෙන් විහාරය සහ කටාරම් කෙටූ ලෙන් දෙක.
62. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහවලතැන්න ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මහවලතැන්න ශ්‍රී චන්ද්‍රසේකර මුදලින්දාරාම පුරාණ විහාර භූමියට අයත් පැරණි ප්‍රතිමා ගෘහය සහ හේවිසි මණ්ඩපය.
63. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොළොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මඩුවන්වල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි දෙදරන්ගමුව ග්‍රාමයට අයත් මඩුවන්වල පරපුරේ සොහොන් භූමිය.
64. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොළොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මඩුවන්වල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි දික්වෙලේගොඩ ග්‍රාමයට අයත් පැරණි දාගැබ.
65. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොළොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොළොන්න ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කොළොන්න පුරාණ විහාර භූමියට අයත් (අත්තථාරාම පුරාණ විහාරය)පැරණි බුද්ධ ප්‍රතිමාව.
66. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොළොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 210 දාපනේ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි දාපනේ ශ්‍රී ජයසුන්දරාරාම රජමහා විහාර භූමියට අයත් ටැම්පිට විහාරය.
67. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොළොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 208 කඹුරුගමුව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි හල්වින්න ශ්‍රී ජයමහා විහාර භූමියට අයත් පැරණි විහාර මන්දිරය
68. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කපුහේන්තොට ග්‍රාම නිලධාරි වසමේ පිහිටි පනාවැන්න අභයතිලකාරාම පුරාණ විහාර භූමියට අයත් පැරණි චිත්‍ර මූර්ති සහිත ප්‍රතිමා ගෘහය සහ ප්‍රාකාරය.
69. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාකදුර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මාකදුර පුරාණ විහාර භූමියට අයත් පැරණි චිත්‍ර සහ මූර්ති සහිත ප්‍රතිමා ගෘහය, ආවාස ගෙය සහ ප්‍රාකාරය.
70. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හිඟුල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි හිඟුල රජමහා විහාර භූමියට අයත් ටැම්පිට විහාරය.
71. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පූනාගල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි බ්‍රෝටන් වතුයායේ ඉදිකර ඇති බ්‍රෝටන් බංගලාව, ගවමඩුව හා කාර්යාල ගොඩනැගිල්ල.
72. නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උණුවතුර බුබුල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි වෙහෙරගල ග්‍රාමයට අයත් කටාරම් සහිත ලෙන් සමූහය, පර්වත ලිපිය, පැරණි ස්තූප ගොඩැල්ල.
73. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 87, ගෝතමී පුර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ගෝතමී පුර ග්‍රාමයේ ගෝතමී විහාර භූමියට අයත් පැරණි චිත්‍ර මූර්ති සහිත විහාර ගෙය.

07-86

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### සීමාසහිත සෙලාන් බැංකුව-ජාඇල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007 මාර්තු මස 05 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0270-747377-001.

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් එස්. සී. රණවීර විසින් සහතික කරන ලද 1997 නොවැම්බර් මස 24 දිනැති අංක 3051 සහ 1997 දෙසැම්බර් මස 01 දිනැති අංක 3058 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, කොළඹ 12 ලියාපදිංචි එන්(පීවීඑස්) 9296 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ජනරජය තුළ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන උපාලි ගාමන්ට්ස් ප්‍රයිවට් ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දෙකෝටි විසිඅටලක්ෂ හැට හතර දහස් තුන්සිය අනූහතරයි ශත පනස් දෙකක (රු. 2,28,64,394.52) මුදලක්

2006 ජුලි මස 31 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 2,28,64,394.52 මුදල ද, 2006 අගෝස්තු මස 01 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් තුන (33%) බැගින් වූ පොලිය සමඟ ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 3051 සහ 3058 දරන බැඳුම්කර මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උගස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා පරිපාලන සීමාව තුළ නිව් බසාර් කොට්ඨාශ අංක 12 පිහිටි (කලින් ශ්‍රී සංඝරාජ මාවත නමින් හඳුන්වනු ලැබූ) ශ්‍රී සුමනතිස්ස මාවත කැබලි අංක : එක්ස් ලකුණු කළ වරිපනම් අංක 568/25 (කොටසක්) දරන ඉඩම් කොටසට මායිම්, උතුරට : ග්‍රෑන්ඩ්පාස් පාර වරිපනම් අංක ජී98 දරන පරිශ්‍රය ද, නැගෙනහිරට : ග්‍රෑන්ඩ්පාස් පාර වරිපනම් අංක 104 දරන පරිශ්‍රය ද, දකුණට : ශ්‍රී සුමණතිස්ස මාවතේ සිට කැබලි අංක එච් දරන (අඩි 40ක් පළල) පුද්ගලික පාර සහ බස්නාහිරට : ජී2ඊ කැබැල්ල යන මායිම් තුළ බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් සාදන ලද 1988.07.30 දිනැති අංක 2097 දරන සැලැස්ම අනුව පර්චස් විස්සයි දශම තුනයි හයක් (අ. 0. රූ. 0, පර්. 20.36) විශාල එහි පිහිටි ගොඩනැගිලි, වගා සමඟ ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත් ඉරුව ඒ 943/49, 50 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -නීති.

07-66

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කළ සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 1900000726.

ණයකරුගේ සම්පූර්ණ නම : අසනා මරික්කාර් මොහොම්මදු ලාහීර්.

කටුනේරිය ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. එම්. එච්. දාබරේරා විසින් ලියා සහතික කරන ලද අංක 123 හා 1997.06.10 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධිත) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් තිස්පන් දහස් හාරසිය දාහතයි ශත හතලිස් නමයක (රු. 35,417.49) ක මුදලක් වර්ෂ 2004.01.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් තිස්දහස් දෙසීය අනූදෙකයි ශත අටක් (රු. 30,292.08) මුදල ද වර්ෂ 2004.01.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් පන් දහස් එකසිය විසිපහයි ශත හතලිස් එකක් (රු. 5,125.41) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් තිස්පන් දහස් හාරසිය දාහතයි ශත හතලිස් නමයක (රු. 35,417.49) ද,

(2) එකී රුපියල් තිස්දහස් දෙසීය අනූදෙකයි ශත අටක (රු. 30,292.08) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17% බැගින් වන පොළියක් 2004.02.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. පී. සී. පෙරේරා යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2004ක් වූ මාර්තු මස 30 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, පණ්ඩිත පත්තුවේ, කුමාර වන්නි පළාතේ, ආනමඩුව පුත්තලම ලියාපදිංචි කොට්ඨාශයේ ආනමඩුව ප්‍රාදේශීය සභාවේ තට්ටේව ග්‍රාමයේ පලුගහහේන නැමැති ඉඩමට 1986.01.30 දින ඒ. ඊ. විජේසූරිය මානක තැන විසින් මැන සම්පාදිත අංක 2455 පිඹුර ප්‍රකාර ලොට් 27, උතුරට : එම පිඹුරේම ලොට් 28 ද, නැගෙනහිරට : සියඹලාගහ ද, දකුණට : එම පිඹුරේම ලොට් 26 ද සහ බස්නාහිරට : එම පිඹුරේම ලොට් 40 (මාර්ග රක්ෂිතය) පර්චස් විස්සක (අ. 0, රූ. 0, පර්. 20) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවය ද සමඟ පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එස් 49/29හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරි.

07-119

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කළ සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 19/0/00/01755.

ණයකරුගේ සම්පූර්ණ නම : තෙබුවනගේ ජයලත් කුසුමාවතී.

කුලියාපිටිය ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. එම්. පී. එල්. වඩුගෙදර විසින් ලියා සහතික කරන ලද අංක 2229 හා 1999.10.01 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධිත) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් අසූඑක්දහස් හයසිය තිස්අටයි ශත අනූඑකක (රු. 81,638.91) ක මුදලක් වර්ෂ 2003.12.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හැත්තෑදහස් දෙසීය දාහතරයි ශත තිස්දෙකක (රු. 70,214.32) මුදල ද වර්ෂ 2003.12.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් එකොලොස් දහස් හාරසිය විසිහතරයි ශත පනස්නමයක (රු. 11,424.59) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් අසූඑක්දහස් හයසිය තිස්අටයි ශත අනූඑකක් (රු. 81,638.91) ද,

(2) එකී රුපියල් හැත්තෑදහස් දෙසීය දාහතරයි ශත තිස්දෙකක (රු. 70,214.32) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.5% බැගින් වන පොළියක් 2004.01.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. එම්. අයි. ගල්ලැල්ල යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2004 ක් වූ පෙබරවාරි මස 25 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කරන ලදී.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල හත් පත්තුවේ, යාගම් පත්තු කෝරළේ, බිංගිරිය ප්‍රාදේශීය සභා සීමාවේ (දුම්මලසූරිය උප කාර්යාලයේ) සියඹලාගස්රුප්ප ග්‍රාමයෙහි පිහිටි මහලක්ෂ්මී වතුයාය *හෙවත්* මඩවලගාර වත්ත නමැති ඉඩමට 1998.11.05 දින ඒ. ඒ. විමලසේන මානක තැන විසින් මැන සම්පාදිත අංක 1899 පිඹුර ප්‍රකාර ලොට් 1ට මායිම්, උතුරට : වෛද්‍ය ටී නාගේන්ද්‍ර සහ අනික් අයට අයත් ඉඩම ද, නැගෙනහිරට : පිඹුරු අංක 581ඒ හි ලොට් 19 ද, දකුණට : පිඹුරු අංක 581ඒ හි අඩි 16 පළල පාර සඳහා වෙන් කරන ලද ලොට් 13 ද, බස්නාහිරට : පිඹුරු අංක 581ඒ හි ලොට් 17 ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකක (අ. 0, රූ. 1, පර්. 0) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවය ද සමඟ කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ආර් 48/220හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරි.

07-118

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කළ සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0135500191 සහ 0130000097.

ණයකරුගේ සම්පූර්ණ නම : විජේසූරිය ආරච්චිගේ දොන් අරෝෂ.

කොළඹ, හෝමාගම ප්‍රසිද්ධ නොතාරිස් ටී. ඩී. රණසිංහ සහ ඒ. එම්. ඩබ්. ජයතිලක විසින් ලියා සහතික කරන ලද අංක 2009, 2776 හා 2003.12.02, 2002.01.23 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් හාරලක්ෂ හතලිස් දෙදහස් නමසිය හැත්තෑපහයි ශත හැටහතක (රු. 4,42,975.67) ක මුදලක් වර්ෂ 2006.04.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හාරලක්ෂ පන්දහස් එකසිය පනස්තුනයි ශත දෙකක (රු. 4,05,153.02) මුදල ද වර්ෂ 2006.04.30 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් තිස්හත්දහස් අටසිය විසිදෙකයි ශත හැටපහක් (රු. 37,822.65) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හාරලක්ෂ හතලිස් දෙදහස් නමසිය හැත්තෑපහයි ශත හැටහතක් (රු. 4,42,975.67) ද,

(2) එකී රුපියල් හාරලක්ෂ පන්දහස් එකසිය පනස්තුනයි ශත දෙකක (රු. 4,05,153.02) මුදල මත අයවිය යුතු වර්ෂයකට 9.50%, 15.90% බැගින් වන පොළියක් 2006.05.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2006 ක් වූ ජුනි මස 12 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කරන ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලෙ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාවේ, වැලිකඩ ග්‍රාමයෙහි උද්‍යාන පටුමගෙහි වරිපනම් අංක 11/12හි පිහිටි ඉඩමට 2001.01.22 දින ජී. එච්. එම්. එල්. ප්‍රේමචන්ද්‍ර විසින් මැන සම්පාදිත අංක 1889 පිඹුර ප්‍රකාර ලොට් ඒට මායිම්, උතුරට : උද්‍යාන පටුමහෙහි වරිපනම් අංක 15/11 (පිඹුරු අංක 1261හි ලොට් 1හි දැක්වෙන දේපළ) ද, නැගෙනහිරට : උද්‍යාන පටුමගෙහි වරිපනම් අංක 27හි දැක්වෙන දේපළ ද, දකුණට : උද්‍යාන පටුමඟ ද, බස්නාහිරට : පාර (අඩි දොළහක් පළල) ද යන මායිම් තුළ පිහිටි පර්චස් පහයි දශම පහයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 5.50) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද මාර්ග පරවශතාවය ද සමඟ ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1580/31හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරි.

07-122

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කළ සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 1905500108.

ණයකරුගේ සම්පූර්ණ නම : පෝරුතොටගේ නෙල්සන් චන්ද්‍රසිරි ප්‍රනාන්දු සහ ජීවිත භුක්තිකරු කොළඹගේ විනිප්‍රීඩා ප්‍රනාන්දු.

නයිනමඩම ප්‍රසිද්ධ නොතාරිස් අයි. සී. කළුආරච්චි විසින් ලියා සහතික කරන ලද අංක 2226 හා 2003.10.03 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධිත) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ තිස්දෙදහස් තුන්සිය අටයි ශත තිස්හතක (රු. 2,32,308.37) මුදලක් වර්ෂ 2006.01.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ එකොලොස් දහස් එකසිය හතයි ශත පනස් තුනක (රු. 2,11,107.53) මුදල ද වර්ෂ 2006.01.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් විසිඑක්දහස් දෙසීයයි ශත අසූහතරක් (රු. 21,200.84) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ තිස්දෙදහස් තුන්සිය අටයි ශත තිස්හතක (රු. 2,32,308.37) ද,

(2) එකී රුපියල් දෙලක්ෂ එකොලොස් දහස් එකසිය හතයි ශත පනස් තුනක (රු. 2,11,107.53) මුදල මත අයවිය යුතු වර්ෂයකට 9.50% බැගින් වන පොළියක් 2006.02.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. පී. සී. පෙරේරා යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2006ක් වූ මාර්තු මස 28 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ඒකමතිකව යෝජනා සම්මත කරන ලදී.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරළේ, කම්මල් පත්තුවේ, මාරවිල ලියාපදිංචි කොට්ඨාසයේ වෙන්නප්පුව ප්‍රාදේශීය සභා සීමාවේ බොරලැස්ස ග්‍රාමයෙහි පිරිස්වත්ත *හෙවත්* ගලවත්ත නමැති ඉඩමට 2003.06.13 දින වයි. එම්. ආර්. යාපා මානකතැන විසින් මැන සම්පාදිත අංක 8685 පිඹුර ප්‍රකාර ලොට් 1ට මායිම්, උතුරට : PP/A 1692 හි ලොට් 107 ද, නැගෙනහිරට : PP/A 1692 හි ලොට් 101හි ලකුණු කරන ලද ප්‍රාදේශීය සභා පාර ද, දකුණට : PP/A 1692 හි ලොට් 105 ද, බස්නාහිරට : PP/A 1692 හි ලොට් 108 යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් අටක් (අ. 0, රූ. 1, පර්. 8) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේ ද මාර්ග පරවශතාවය ද සමඟ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පුත්/වෙන්/45/82 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය,

සාමාන්‍යාධිකාරි.

07-120

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව

(කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 19/0/00/01136.

ණයකරුගේ සම්පූර්ණ නම : හතුරුසිංහ දේවගේ ගාමිණී ජයලත්.

නයිනමඩම ප්‍රසිද්ධ නොතාරිස් අයි. සී. කලුආරච්චි විසින් ලියා සහතික කරන ලද අංක 753 හා 1998.03.25 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු සංස්ථාව යනුවෙන් හඳුන්වනු ලබන 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ පනස් හය දහස් එකසිය හැට තුනයි ශත තිස් හතක (රු. 1,56,163.37) මුදලක් වර්ෂ 2002.06.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ හත් දහස් පහළොවයි ශත විසිපහක (රු. 1,07,015.25) මුදල ද වර්ෂ 2002.06.30 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් හතලිස් නව දහස් එකසිය හතලිස් අටයි ශත දොළහක් (රු. 49,148.12) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ පනස් හය දහස් එකසිය හැට තුනයි ශත තිස් හතක් (රු. 1,56,163.37) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ හත් දහස් පහළොවයි ශත විසිපහක (රු. 1,07,105.25) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17% බැගින් වන පොළියක් 2002.07.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. එම්. අයි. ගල්ලැල්ල යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරන ලදී.

### දේපල පිළිබඳ විස්තරය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ලියාපදිංචි කොට්ඨාසයේ දකුණු කටුගම්පල කෝරළේ, කටුගම්පල හත්පත්තු තලාහිටිමුල්ල පිහිටි හික්ගහමුලවත්ත හා හුරිගහමුලවත්ත නමැති ඉඩම 1997.05.16 දින වයි. එම්. ආර්. යාපා මානකතැන විසින් සැකසූ අංක 5506 පිඹුර ප්‍රකාර කැබලි 3ට මායිම්, උතුරට : කැබැලි 2 (ඉහත පිඹුර පරිදි) ද, නැගෙනහිරට : ඇල ද, දකුණට : කැබලි 4 ඉහත පිඹුර පරිදි ද, බස්නාහිරට : පාර (ප්‍රාදේශීය සභා) යන මායිම් තුළ පිහිටි රූඩ් එකක (අ. 0, රූ, 1, පර්. 0) වපසරියකින් යුතු වූ ඉඩම කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කේ. 136/265හි ලියාපදිංචි කරන ලදී.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය,

වර්ෂ 2002ක් වූ අගෝස්තු මස 30 වැනි දින කොළඹ දී ය.

සාමාන්‍යාධිකාරි.

07-123

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව

(කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 1900000868.

ණයකරුගේ සම්පූර්ණ නම : බෝහිංගම මුදියන්සේලාගේ ජයතිලක.

කටුනේරිය ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එම්. එච්. දාබරේරා විසින් ලියා සහතික කරන ලද අංක 127 හා 1997.07.10 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු සංස්ථාව යනුවෙන් හඳුන්වනු ලබන 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් අනූදෙදහස් හයසිය හතරයි ශත විසිදෙකක (රු. 92,604.22) මුදලක් වර්ෂ 2002.06.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් පනස්හත්දහස් හාරසිය හතරයි ශත අසූවක (රු. 57,404.80) ද වර්ෂ 2002.06.30 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් තිස්පන්දහස් එකසිය අනූනවයයි ශත හතලිස් දෙකක් (රු. 35,199.42) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් අනූදෙදහස් හයසිය හතරයි ශත විසිදෙකක (රු. 92,604.22) ද,

(2) එකී රුපියල් පන්ස්හත්දහස් හාරසිය හතරයි ශත අසූවක (රු. 57,404.80) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17% බැගින් වන පොළියක් 2002.07.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්ලිව්. පී. සී. පෙරේරා යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරන ලදී.

#### දේපළ පිළිබඳ විස්තරය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, පුත්තලම ලියාපදිංචි කොට්ඨාසයේ කුමාරවන්නි පළාතේ, පන්ඩිතපත්තුවේ තට්ටේව ගමේ පිහිටි පලුගහහේන නමැති ඉඩමට 1986.01.30 දින ඒ. ඊ. විජේසූරිය මානකතැන විසින් මැන සාදිත අංක 2455 දරන පිඹුරේ අංක 35 දරන කොටසේ උතුරට : මෙම පිඹුරේම කැබලි අංක 38 සහ 39 ද, නැගෙනහිරට : කැබලි 36, දකුණට : කැබලි 34 ද, බස්නාහිරට : පාරක් සඳහා වෙන් කර ඇති කැබලි 40 ද යන මායිම් තුළ පිහිටි පර්චස් විස්සක (අ. 0, රූ. 0, පර්. 20) විශාල ඉඩම මාර්ග පරවශතාවයත් සමඟ වේ. මෙම ඉඩම පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී එස් 49/37හි ලියාපදිංචි කරන ලදී.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය,
වර්ෂ 2002ක් වූ අගෝස්තු මස 30 වැනි දින දී ය.

සාමාන්‍යාධිකාරී.

07-121

---

### සේලාන් බැන්ක් පීඑල්සී (ලියාපදිංචි අංකය : පීක්‍යු 9)-මිලේනියම් ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සේලාන් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සේලාන් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.05.24 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

ගිණුම් අංකය : 0860-040744-001

සේලාන් බැන්ක් පීඑල්සී නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් එස්. කුගදරන් විසින් සහතික කරන ලද 2004.10.26 දිනැති අංක 635 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම කොලොන්නාව, අයිඩීඑච් පාර, අංක 300හි සිය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති ලියාපදිංචි අංක එන්(පීවීඑස්) 30106 දරන යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන ඒසී පුඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදායී/ උකස්කරු වශයෙන් රුපියල් එකසිය විසිතුන් ලක්ෂ හතලිස් හයදහස් හත්සිය දොළහයි ශත හැට හතරක (රු. 1,23,46,712.64) මුදලක් 2006 දෙසැම්බර් මස 31 වැනි දින වන විට සේලාන් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 1,23,46,712.64 මුදල ද, 2007 ජනවාරි මස 01 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් තුන (33%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 635 දරන බැඳුම්කරය මගින් සේලාන් බැන්ක් පීඑල්සී වෙත උකස්කර ඇත්තතාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සේලාන් බැන්ක් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### 1 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දකුණු අළුත්කුරු කෝරළේ, අඹතලෙන් පහළ කොලොන්නාව නගර සභා සීමාව තුළ එගොඩ කොලොන්නාව පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. ඒ. රුබසිංහ විසින් සාදන ලද 1952.11.03 දිනැති අංක 418 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලියනගහවත්ත සහ දෙල්ගහවත්ත නමැති ගොඩනැගිලි, යන්ත්‍ර සූත්‍ර, සහ සවිකළ ද්‍රව්‍ය සහ උපකරණ සමග ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමඟ ඉඩමේ විජය පාර වරිපනම් අංක 68 (කොටසක්) දරන කැබලි අංක 6 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : රජයේ ඉඩම ද, නැගෙනහිරට : පාර ද, දකුණට : කැබැලි අංක 5 සහ බස්නාහිරට : කැබැලි අංක 7 ද යන මායිම් තුළ එකී අංක 418 දරන සැලැස්ම අනුව රූඩ් එකයි පර්චස් දහඅටයි දශම පහක් (අ. 0. රූ. 1, පර්. 18.5) විශාල ඉඩම. මෙය කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් බී 903/12 යටතේ ලියාපදිංචි කර ඇත.

#### 2 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දකුණු අළුත්කුරු කෝරළේ, අඹතලෙන් පහළ කොලොන්නාව නගර සභා සීමාව තුළ එගොඩ කොලොන්නාව පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. ඒ. රුබසිංහ විසින් සාදන ලද 1952.11.03 දිනැති අංක 418 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලියනගහවත්ත සහ දෙල්ගහවත්ත නමැති ඉඩමේ කැබලි අංක 7 (පාර සඳහා වෙන් කිරීම) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : විජය පාර ද, නැගෙනහිරට : කැබලි අංක 6, 5 සහ 4 ද, දකුණට : කැබැලි අංක 4 සහ බස්නාහිරට : කැබලි අංක 3, 2 සහ 1 ද යන මායිම් තුළ පෙර කී අංක 418 දරන සැලැස්ම අනුව පර්චස් දහ හතක් (අ. 0, රූ. 0, පර්. 17) විශාල ඉඩම. මෙය කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් බී 890/46 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -නීති.

07-67

---

### සීමාසහිත සෙලාන් බැංකුව-මාතලේ ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.04.16 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

ගිණුම් අංකය : 0380-1232990-001.

"සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් එස්. පරමසෝදි විසින් සියල්ලම සහතික කරන ලද 2003 දෙසැම්බර් 11 දිනැති අංක 1306, 1308 සහ 1310 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, මාතලේ පදිංචි අබ්දුල් අසීස් මොහමඩ් සුල්තාන් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් විසිහය ලක්ෂ හයදහස් හත්සිය පනස්පහයි ශත අනූ දෙකක (රු. 26,06,755.92) මුදලක් 2006 අප්‍රේල් මස 17 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 26,06,755.92 මුදල ද, 2006 අප්‍රේල් මස 18 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් තුන (33%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස එකී 1306, 1308 සහ 1310 දරන බැඳුම්කර මගින් මෙහි පහත සඳහන් 1 වැනි, 2 වැනි සහ 3 වැනි උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුව් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.".

#### 1 වැනි උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ දකුණ ගම්පහ සියපත්තුවේ උඩුගම පිහිටි බලයලත් මිනින්දෝරු එම්. රාජසේකරන් විසින් සාදන ලද 2000.12.10 දිනැති අංක 5272 දරන සැලැස්මේ සඳහන් නිකවෙල එස්ටේට් නමැති ඉඩමෙන් කැබලි අංක 1 සිට 8 ලෙස පෙන්නුම් කරනු ලබන යාබද ඉඩම් කැබලිවලට මායිම්, ඊසානට : ප්‍රධාන පාරට යන එස්ටේට් පාර ද, උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද, නිරිතට : කාණුව සහ බස්නාහිරට : එස්ටේට් පාර ද යන මායිම් තුළ රූඩ් තුනයි පර්චස් විසි හතයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 3, පර්. 27.50) විශාල එහි පිහිටි සියලු දේ සමඟ ඉඩම.

#### 2 වැනි උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ දකුණ ගම්පහ සියපත්තුවේ උඩුගම පිහිටි බලයලත් මිනින්දෝරු එම්. රාජසේකරන් විසින් සාදන ලද 2000.12.13 දිනැති අංක 5273 දරන සැලැස්මේ සඳහන් නිකවෙල එස්ටේට් නමැති ඉඩමෙන් කැබලි අංක 1 සිට 8 සහ 10 සිට 11 ලෙස පෙන්නුම් කරනු ලබන යාබද ඉඩම් කැබලිවලට මායිම්, උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද, දකුණට සහ ගිණිකොණට : එකී සැලැස්මේ සඳහන් කැබලි අංක 9, එස්ටේට් පාර සහ මෙම ඉඩමේ ඉතිරි කොටස ද, නිරිතට සහ බස්නාහිරට : එස්ටේට් පාර ද යන මායිම් තුළ රූඩ් තුනයි පර්චස් පහලොවයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 3, පර්. 15.50) විශාල එහි පිහිටි සියලු දේ සමඟ ඉඩම.

#### 3 වැනි උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ දකුණ ගම්පහ සියපත්තුවේ උඩුගම පිහිටි බලයලත් මිනින්දෝරු එම්. රාජසේකරන් විසින් සාදන ලද 2000.12.19 දිනැති අංක 5274 දරන සැලැස්මේ සඳහන් නිකවෙල එස්ටේට් නමැති ඉඩමෙන් කැබලි අංක 1 සිට 4 ලෙස පෙන්නුම් කරනු ලබන යාබද ඉඩම් කැබලි වලට මායිම් ඊසානට : කාණුව ද, දකුණට, ගිණිකොණට සහ නිරිතට : එස්ටේට් පාර ද යන මායිම් තුළ රූඩ් එකයි, පර්චස් විසිහයයි දශම හයයි බිංදුවක් (අ. 0, රූ. 1, පර්. 26.60) විශාල එහි පිහිටි සියලු දේ සමඟ ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -නීති.

07-69

---

### සීමාසහිත හැටන් නැෂනල් බැංකුව-කුරුණෑගල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2007 මැයි මස 24 වැනි දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හේවාපතිරණ විසින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියා සහතික කරන ලද්දා වූ 2002.09.04 දිනැති සහ අංක 176 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම නිස්සංක ආරච්චිගේ වික්‍රම නිස්සංක ණයකරු හැටියට, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හාරලක්ෂ තිස්පන්දහස් එකසිය පනස් හතර (රු. 4,35,154) ක මුදලක් 2007.04.30 වැනි දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 4,35,154ක මුදලට 2007.05.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේනම් ඒ මුදල අඩුකොට එකී අංක 176 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපොළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එන්. එච්. පී. එෆ්. ආරියරත්න මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වෙයුදවිල්ලු හත්පත්තුවේ මීගොඩ කෝරළේ, මහගල්ගොඩ, මිල්ලෑව ගමේ පිහිටි "බණ්ඩාරවත්ත" නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක එම්. ඩබ්. ආරියරත්න විසින් මැන සාදන ලද 1998.05.30 දිනැති අංක 98/279 දරන පිඹුරේ ලොට් අංක 7 ලෙස නිරූපිත බෙදා වෙන් කර සලකුණු කර ඇති ඉඩම් කොටසට උතුරට : මෙම පිඹුරේම ලොට් 4, 5, 6, 6ඩී4, සහ 6ඩී3, නැගෙනහිරට : පාරෙන් ද, දකුණට : අංක 1491 දරන පිඹුරේ ලොට් 78 සහ 74න් ද, බස්නාහිරට : අංක 1491 දරන පිඹුරේ ලොට් 77න් ද, මායිම් වූ පර්චස් දහඅටයි දශම හයයි (අ. 0, රූ. 0, පර්. 18.6)ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි සියළු දේත් හා බලයලත් මානක එම්. ඩබ්. ආරියරත්න විසින් මැන සාදන ලද අංක 98/279 දරන පිඹුරේ ලොට් 6සී සහ 6ඩී4 මතින් හා දිගට මාර්ග අයිතිය ද සමඟ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 1431/177 වෙළුමේ හා පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ලොට් 7 දරන ඉඩම බලයලත් මානක එම්. ඩබ්. ආරියරත්න විසින් මැන සාදන ලද අංක 115/2002 දරන පිඹුරේ මෙසේ විස්තර කර ඇත :

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හත්පත්තුවේ වෙයුදවිල්ලි, මීගොඩ කෝරළේ, මහගල්ගොඩ, මිල්ලෑව ගමේ පිහිටි "බණ්ඩාරවත්ත" නමින් හඳුන්වනු ලබන ඉඩමට ඉහත කී පිඹුරට අනුව බෙදා වෙන් කර සලකුණු කරන ලද ලොට් 1 නැමැති ඉඩම් කැබැල්ල, උතුරට : ලොට් 4, 5, 6, 6ඩී3, සහ 6ඩී4 නැගෙනහිරට : පාරෙන් ද, දකුණට : බලයලත් මානක ඩබ්. ඩී. බී. රෙජිනෝල්ඩ් විසින් මැන සාදන ලද අංක 1491 දරන පිඹුරේ ලොට් 74 සහ ලොට් 78න් ද, බස්නාහිරට : බලයලත් මානක ඩබ්. ඩී. බී. රෙජිනෝල්ඩ් විසින් මැන සාදන ලද අංක 1491 දරන පිඹුරේ ලොට් 77න් ද, මායිම් වූ පර්චස් දහඅටයි දශම හයයි (අ. 0, රූ. 0, පර්. 18.6) ක් විශාල ඉඩම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණී ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මණ්ඩලයේ ලේකම්.

07-135/3

---

### සීමාසහිත හැටන් නැෂනල් බැංකුව-මොණරාගල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2007 මැයි මස 24 වැනි දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් අයි. එම්. පී. ආනන්ද විසින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියා සහතික කරන ලද්දා වූ 1999.11.10 දින සහ 2000.09.20 දිනැති සහ පිළිවෙලින් අංක 7201 සහ 7952 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සුවන්ද හෙන්නැදිගේ පියසේන ද සිල්වා ණයකරු හැටියට, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් තිස්හතර ලක්ෂ හැටදහස් තුන්සිය තිස්දෙකයි ශත තිස්හතර (රු. 34,60,332.34) ක මුදලක් 2006.08.31 වැනි දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 34,60,332.34ක මුදලට 2006.09.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේනම් ඒ මුදල අඩුකොට එකී අංක 7201 සහ 7952 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දෙප්ළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එන්. එච්. පී. එෆ්. ආරියරත්න මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මොණරාගල කොට්ඨාසයේ, බුත්තල, වැදිරට කෝරළේ, බුත්තල, මුප්පන, මොණරාගල නගරයේ පිහිටි "එගොඩවත්තහේන" නමින් හඳුන්වනු ලබන ඉඩමෙන් බෙදා වෙන් කරන ලද ඉඩමේ කොටස වන මොණරාගල දිස්ත්‍රික් උසාවියේ 261 දරන නඩුවේ ගොණු කර ඇති සහ බලයලත් මානක එච්. ටී. ඕරන්ස් විසින් මැන සාදන ලද 1970.11.06 දිනැති අංක 699 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 01 ලෙස නිරූපිත ඉඩම් කොටසට, උතුරට : එම්. බී. ධර්මදාස සහ අනිත් අයට අයිති ඉඩම් වෙන් කෙරෙන ඉනි වැටෙන් සහ කම්බි වැටෙන් ද, නැගෙනහිරට : එම්. බී. ධර්මදාසට අයිති ඉඩම හා තාප්පය වෙන් කෙරෙන ඉනි වැටෙන් සහ කම්බි වැටෙන් ද, දකුණට : කුමාර දොල පාරෙන් සහ බස්නාහිරට : ලක්ෂ්මන් සිල්වාට අයිති ඉඩම වෙන් කෙරෙන ඉනි වැටෙන් සහ කම්බි වැටෙන් ද මායිම් වූ පර්චස් දහඅටයි දශම හයයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 18.60) විශාලත්වය සහිත ඉඩම සහ ඒ තුළ පිහිටි සියළු දේත් සමඟ මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල් 32/266 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණී ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මණ්ඩලයේ ලේකම්.

07-135/2

---

### මහජන බැංකුව - දංකොටුව ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.05.19 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

මාරවිල ප්‍රසිද්ධ නොතාරිස් රුවිනි ඒ. එස්. දසනායක මහත්මිය විසින් සහතික කරන ලද 2005.08.23 දිනැති අංක 3055 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් කුඹලාතර ආරච්චිලාගේ දොන් මහේෂ් කුමාර් පොතුවිල සහ කුඹලාතර ආරච්චිලාගේ දෝන අනෝමා ශිරාමනි පොතුවිල යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් දහතුන් ලක්ෂ පනස් එක් දහස් හයසිය හැත්තෑ නවයයි ශත අනූ පහ (රු. 13,51,679.95) ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2006.03.05 දින සිට වර්ෂයකට 16.5% බැගින්, රුපියල් දහතුන් ලක්ෂ පනස් එක් දහස් හයසිය හැත්තෑ නවයයි ශත අනූ පහ (රු. 13,51,679.95) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාළ මහජන බැංකු පනතේ 29 එල් (29L) වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව, එකී රුපියල් දහතුන් ලක්ෂ පනස් එක් දහස් හයසිය හැත්තෑ නවයයි ශත අනූ පහ (රු. 13,51,679.95) ක මුදල අයකර ගැනීම සඳහා මීගමුව බලයලත් වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා මහතා විසින් එකී අංක 3055 දරන උකස්කරය යටතේ, එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව, මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තර

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ඉඩම් ලියාපදිංචි කොට්ඨාසයට අයත් දකුණු පිටිගල් කෝරලේ, ඕතර පළාතේ, නැගෙනහිර කිරිමැටියාන නමැති ගමේ පිහිටි මීගහවත්ත නමැති ඉඩමට වයි. එම්. රංජිත් යාපා, බලයලත් මානක තැන විසින් 2001.12.11 දින මැන සාදන ලද අංක 7847 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 01 දරන ඉඩමට මායිම්, උතුරට : ප්‍රාදේශීය සභා පාර ද, නැගෙනහිරට : උපාලි ජයසිංහගේ ඉඩම ද, දකුණට : ඇල ද, බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටසද යන මායිම් තුළ වූ ප්‍රමාණයෙන් අක්කර බිංදුවයි රූඩ් බිංදුවයි, පර්චස් තිස් නවයයි දශම හත (අක්. 00, රූඩ් 00, පර්. 39.7) ක් විශාල ඉඩම් බිම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු ගොඩනැගිලි යනාදී සැම සියලු දේද වේ.

මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E 94/60 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
හලාවත.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 79, මාරවිල පාර,
නාත්තන්ඩිය.

07-97

---

**සීමාසහිත සෙලාන් බැංකුව - විදේශ මුදල් බැංකු ඒකකය**

**1990 අංක 4 බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද සම්මුතිය**

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007 අප්‍රේල් මස 16 වන දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 9911-089882-001.

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඊ. එස්. පීරිස් විසින් සහතික කරන ලද 1999.07.09 දිනැති අංක 1910 දරන උගස්කරය සහ සෙලාන් බැංකුව නමට ලියන ලද 1999.06.24 දිනැති යන්ත්‍ර සූත්‍ර උගස්කර අංක එෆ්සීබීයූ/එම්එම්/990003 සහ 2003.12.31 දිනැති අංක එෆ්සීබීයූ/එස්එම්/03/021 දරන උකස්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම කොළඹ 11හි සිට ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති ලියාපදිංචි අංක එන් (පීවීස්) 5213 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන කොස්මොස් මැකී ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ් යන සමාගම බන්ධනදායි වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ ඇමරිකන් ඩොලර් 2,99,027.88 ක මුදලක් 2004 ජනවාරි මස 30 වන දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී ඇමරිකන් ඩොලර් 299,027.88 ක මුදල ද 2004 ජනවාරි මස 31 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට පිළිවෙලින් වර්ෂයකට සියයට නවය (9%) බැගින් වූ පොලිය සමඟ ප්‍රසිද්ධ කිරීමේ වියදම් දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 1910, සහ අංක එෆ්සීබීයූ/එම්එම්/990003 සහ අංක එෆ්සීබීයූ/එස්/එම්/03/021 දරන බැඳුම්කර මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උගස් කර ඇත්තා වූ මෙහි පහත සඳහන් උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ, පරිශ්‍රය සහ යන්ත්‍ර සූත්‍ර බලයලත් වෙන්දේසිකාර ඩන්ස්ටන් කෙලාර්ට් මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**පළමු උපලේඛනය**

1. බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ දාසිය පත්තුවේ ගම්පහ දිස්ත්‍රික් සංවර්ධන සභාවේ කටුනායක-සීදූව උපකාර්යාල සීමාව තුළ දකුණු කදිරාන ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් සාදන ලද 1985 ජුලි මස 12 දිනැති අංක 1230 දරන සැලැස්මේ සඳහන් කදිරානවත්ත නමැති ඉඩමේ කැබැලි අංක 1 ලකුණු කළ (මහ කොළඹ ආර්ථික කොමිසමේ කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපයේ අංක පීසීඊසී/අයිපීඉසෙඩ්/කේ/003 දරන සිතියමේ අදියර 1 පසුතල සැලැස්මේ සීඑම්අයිඑල් කැබැල්ල සේ පෙන්නුම් කරනු ලබන ඉඩමේ මැනීමක් හා අතුරු බෙදීමක් වන) ඉඩම් කොටසට මායිම්, උතුරට : මහ කොළඹ ආර්ථික කොමිසමට අයිති ඉඩම සහ කැබලි අංක 3 මෙහි සඳහන් (මීටර් 5 ක් පළල පාර සඳහා වෙන් කිරීම), නැගෙනහිරට : මෙහි සඳහන් කැබැලි අංක 2 ද, දකුණට : මහ කොළඹ ආර්ථික කොමිසමට අයිති ඉඩම සහ කැබලි අංක 3 මෙහි සඳහන් (මීටර් 5 ක් පළල පාර සඳහා වෙන් කිරීම) ද සහ බස්නාහිරට : රිං රෝඩ් 11 සහ වෙන් කළ ඉඩම යන මායිම් තුළ එකී අංක 1230 දරන සැලැස්ම අනුව අක්කර එකයි, රූඩ් දෙකයි, පර්චස් දහයයි දශම දෙකක් (අ.1, රූ. 2, පර්.10.2) විශාල ඉඩම.

පෙර කී අංක 1230 දරන සැලැස්මේ සඳහන් එකී අංක 1 කැබැල්ල පහත සඳහන් ඉඩමෙන් බෙදා වෙන් කළ කොටසක් වේ :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචිකිරීමේ කොට්ඨාසයේ, දාසිය පත්තුවේ කටුනායක -සීදූව සුළු නගර සභා සීමාව තුළ දකුණු කදිරාන ගමේ පිහිටි මහ කොළඹ ආර්ථික කොමිසමේ කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපයේ සිතියම් අංක පීසීඊසී/අයිපීඉසෙඩ්/කේ/003 හි පෙන්නුම් කරනු ලබන අදියර 1 පසුතල සැලැස්මේ සඳහන් කදිරානවත්ත නමැති ඉඩමේ සීඑම්අයිඑල් ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, ඊසානට, ගිණිකොනට සහ නිරිතට : මිනුම්පති විසින් සාදන ලද 1978 මාර්තු 02 දිනැති අංක කේම්/ඒ/78/26 Rev.4 ඇඩ්වාන්ස් ට්‍රේසිං හි සඳහන් මහ කොළඹ ආර්ථික කොමිසමට අයිති ඉඩම් සහ වයඹට : රිං රෝඩ් 11 ද යන මායිම් තුළ එකී අංක පීසීඊසී/අයිපීඉසෙඩ්/කේ/003 දරන සිතියම අනුව අක්කර දෙකයි, රූඩ් දෙකක් (අ. 2, රූ. 2, පර්. 0) විශාල ඉඩම.

මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් සී 686/82 යටතේ ලියාපදිංචි කර ඇත.

2. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ දාසිය පත්තුවේ, ගම්පහ දිස්ත්‍රික් සංවර්ධන සභාවේ, කටුනායක-සීදූව උපකාර්යාල සීමාව තුළ කදිරාන ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් සාදන ලද 1985 ජුලි 12 දිනැති අංක 1230 දරන සැලැස්මේ සඳහන් කදිරානවත්ත නමැති ඉඩමෙන් කැබැලි අංක 2 ලකුණු කළ (මහ කොළඹ ආර්ථික කොමිසමේ කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපයේ අංක පීසීඊසී/අයිපීඉසෙඩ්/කේ/003 දරන සිතියමේ අදියර 1 පසුතල සැලැස්මේ සීඑම්අයිඑල් කැබැල්ල සේ පෙන්නුම් කරනු ලබන ඉඩමේ මැනීමක් හා අතුරු බෙදීමක් වන) ඉඩම් කොටසට මායිම් උතුරට, නැගෙනහිරට සහ දකුණට : මහ කොළඹ ආර්ථික කොමිසමට අයිති ඉඩම, බස්නාහිරට :කැබැලි අංක 1, අංක 3 (මීටර් 5 ක් පළල පාර සඳහා වෙන් කිරීම), යන මායිම් තුළ එකී අංක 1230 දරන සැලැස්ම අනුව රූඩ් තුනයි, පර්චස් දහතුනක් (අ. 0, රූ. 3, පර්.13) විශාල ඉඩම.

මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් සී 626/288 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම් තුළ උඩින්, යටින් සහ දිගේ පූර්ණ සහ නිදහස් අයිතිය, ස්වාධීනත්වය සහ බලය සහිත මාර්ග අයිතිය සහ මාර්ගය පාවිච්චි කරන්නෙකුට ඇති අනිකුත් සියලු අයිතිවාසිකම් සමග.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, දාසිය පත්තුවේ, ගම්පහ දිස්ත්‍රික් සංවර්ධන සභාවේ, කටුනායක-සීදූව උපකාර්යාල සීමාව තුළ කදිරාන ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් සාදන ලද 1985 ජුලි 12 දිනැති අංක 1230 දරන සැලැස්මේ සඳහන් කදිරානවත්ත නමැති ඉඩමෙන් කැබලි අංක 3 ලකුණු කළ (මාර්ගය සඳහා වෙන් කිරීම) (මහ කොළඹ ආර්ථික කොමිසමේ කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපයේ අංක පීසීඊසී/අයිපීඉසෙඩ්/කේ/003 දරන සිතියමේ අදියර1 පසුතල සැලැස්මේ සීඑම්අයිඑල් කැබැල්ල සේ පෙන්නුම් කරනු ලබන ඉඩමේ මැනීමක් හා අතුරු බෙදීමක් වන) ඉඩම් කොටසට මායිම්, උතුරට: කැබැලි අංක 1 ද, නැගෙනහිරට : කැබලි අංක 2 ද, දකුණට : කැබැලි අංක 1 සහ බස්නාහිරට : රිං රෝඩ් 11 සහ වෙන් කළ ඉඩම යන මායිම් තුළ එකී අංක 1230 දරන සැලැස්ම අනුව පර්චස් දහසයයි දශම අටක් (අ. 0, රූ. 0, පර්. 16.8) විශාල ඉඩම.

මෙය මීගමුව ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් සී 626/289 යටතේ ලියාපදිංචි කර ඇත.

**දෙවෙනි උපලේඛනය**

මැෂින් වර්ගය
මාදිලිය
මැෂින් අංකය

| *අයිතම අංකය* | *විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|
| *මහන මැෂින් :* | | |
| බී2 | ජුකී - 357 | 12 |
| ඩී1 | එම්ඕ - 357 | 08 |
| ඊ2 | එල්බීඑච් - 780 | 01 |
| ඊ3 | එල්කේ -1850 | 02 |
| ඊ4 | ඩීඑfප් බී -1404 | 01 |
| ඊ6 | ඩීඩීඑල් -555 | 90 |
| ඊ7 | එම්ඕ -25165 | 11 |
| ඊ9 | 373 | 01 |
| ඊ10 | එල්කේ -1850 | 03 |
| ඊ16 | බීඩීඑල් - 555 | 11 |
| ඊ17 | එල්එච් - 515 | 16 |
| ජී1 | එම්ඕ - 747 | 07 |
| කේ 1 | එම්ඕ - 2366ඊ | 08 |
| කේ 2 | බී - 832 | 06 |
| කේ 6 | එල්එච් - 162 | 02 |
| කේ 13 | බී 8423 | 06 |
| එල් 2 | එfප්ඊඊඩී ටී 2-240 | 19 |
| එල් 3 | බී 832 | 20 |
| එන් 5 | ඩීටී2-බී925 | 10 |
| එන් 7 | ඩීඑල්කේ-800 | 23 |
| පී 3 | එල්කේ-1850 | 05 |
| පී 4 | ඩීඑන්එfප් 500 | 29 |
| පී 5 | ඩීඑන්ටී-860 | 01 |
| පී 6 | එල්ටී2-240 | 09 |
| එස් 1 | බීඩී2-එච් 310 | 20 |
| එස් 2 | කේඑම්-506 | 5 |
| ටී 1 | එල්කේ3-බී434ඊඑක්ස් | 3 |
| *වෙනත් වර්ග :* | | |
| ඒ 9 | මෙට්ල් බට්න් ප්‍රෙස් | 10 |
| බී 1 | ස්ට්‍රැපින් මෙෂින් | 1 |
| බී 6 | බට්න් ප්‍රෙස් | 5 |
| සී 1 | ජෙනරේටර් | 1 |
| ජේ 3 | fපියුසිං මැෂින් | 1 |
| කේ 5 | අන්ඩර් ට්‍රිමිං අවුටිං ස්විච් | 1 |
| කේ 11 | ඊස්ට්මන් කටිං | 2 |
| එල් 5 | බෑන්ඩ් නයිfප් මැෂින් | 1 |
| කිව් 1 | කටිං මැෂින් | 1 |
| ආර් 1 | ඩීසල් බොයිලර් | 1 |
| ටී 3 | ඩීසල් බොයිලර් | 1 |

**තුන්වෙනි උපලේඛනය**

පහත සඳහන් ද්‍රව්‍යවලින් සමන්විත ව්‍යාපාර බඩු තොග නිම වූ සහ නොනිමි භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ අනෙකුත් ද්‍රව්‍ය වෙන් වෙන්ව සහ එක්ව.

අමුද්‍රව්‍ය, උපාංග, ප්‍රගමන වැඩ, නිමි භාණ්ඩ.

අමුද්‍රව්‍ය, උපාංග, ප්‍රගමන වැඩ, නිමි භාණ්ඩ සහ ලීබඩු, සවිකිරීම් සහ වෙනත් සෑම වර්ගයක සහ ඕනෑම ආකාරයක හෝ විස්තරයක චංචල දේපළ (මෙහි මින්මතු පහත සඳහන් වරිපනම් අංක දරන පරිශ්‍රයන්හි තිබෙන බන්ධනදායීගේ ව්‍යාපාර බඩුතොග ද්‍රව්‍ය, නිමවූ සහ නොනිමි භාණ්ඩ යනුවෙන් සාමූහිකව හඳුන්වනු ලබන)

1. අංක 241 ලෙයාර්ඩ් බ්‍රෝඩ් වේ, කොළඹ 14 ;
2. අංක 80, මහා විද්‍යාල මාවත, කොළඹ 13 ; සහ
3. අංක 01 රිං රෝඩ්, බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කය තුළ කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපය

සහ බන්ධනදායී දැනට සිටින හෝ ඕනෑම වේලාවක සහ මින්මතු කලින්කලට පෙර කී දිස්ත්‍රික්කය තුළ ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන සියලු ගුදම් ගබඩා සහ පරිශ්‍රයන්හි හෝ බන්ධනදායීගේ ව්‍යාපාර බඩු තොග, ද්‍රව්‍ය, නිමවූ සහ නොනිමි භාණ්ඩ සහ ඕනෑම මාදිලියක සහ විස්තරයක චංචල දේපළ මෙම බන්ධනය පවත්නා කාලය තුළ මින්මතු කලින්කලට සහ සියලු අවස්ථාවන්හි ගෙන එනු ලැබිය හැකි හෝ බහා තබන හෝ ව්‍යාපාර කටයුතු සඳහා හෝ අලෙවිය හෝ ගබඩා කිරීම සඳහා බන්ධනදායීගේ ව්‍යාපාර බඩුතොග, ද්‍රව්‍ය, නිමි සහ නොනිමි භාණ්ඩ සහ වෙනත් චංචල දේපළ ආදිය මින්මතු ඕනෑම වේලාවක සහ කලින් කලට ගෙනයනු ලබන සියලු හෝ වෙනත් ස්ථානයක් හෝ ස්ථානයන්.

II

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සහ මහ නගර සභාව තුළ කොළඹ වරායේ වාප්පුවල සහ ගුදම්වල ඇති (මෙහි මින්මතු ඒ සියල්ලම බන්ධනදායිගේ වරායේ ද්‍රව්‍ය සහ භාණ්ඩ යනුවෙන් සාමූහිකව හැඳින්වේ)

අමුද්‍රව්‍ය සහ උපාංග, ප්‍රගමන වැඩ, නිමි භාණ්ඩවලින් සැදුම්ලත් ද්‍රව්‍ය, යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ සෑම වර්ගයකම සියලු වෙනත් භාණ්ඩ සාමූහිකව සහ තනි තනිව,

III

බස්නාහිර පළාතේ, මීගමුව දිස්ත්‍රික්කයේ කටුනායක ගුවන් තොටුපළේ ගබඩාවල සහ ගුදම්වල ඇති (මෙහි මින්මතු ඒ සියල්ලම බන්ධනදායීගේ ගුවන්තොටුපොළ ද්‍රව්‍ය සහ භාණ්ඩ යනුවෙන් සාමූහිකව හැඳින්වේ.)

අමුද්‍රව්‍ය සහ උපාංග, ප්‍රගමන වැඩ, නිමි භාණ්ඩ වලින් සැදුම්ලත් ද්‍රව්‍ය, යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ සෑම වර්ගයකම සියලු වෙනත් භාණ්ඩ සාමූහිකව සහ තනි තනිව.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - නීති.

07-68

මුද්‍රණය හා බෙදාහැරීම සීමාසහිත ශ්‍රී ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසිනි.
www.documents.gov.lk